“ මානව හිතවාදී හා ඵලදායී පාසල් මාධ්‍ය සන්නිවේදන සංස්කෘතියක් උදෙසා...”

# පාසල් මාධ්‍ය සමාජ අත්පොත

## School Media Club Handbook



ප්‍රකාශනය
පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන ජාතික වැඩසටහන
ජනමාධ්‍ය පර්යේෂණ අංශය
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

මානව හිතවාදී හා ඵලදායී පාසල් මාධ්‍ය සන්නිවේදන සංස්කෘතියක් උදෙසා

# පාසල් මාධ්‍ය සමාජ අත්පොත

## School Media Club Handbook

විදුහල්පතීහු පාසල් මාධ්‍ය සමාජයේ නියමුවෝය.
ගුරු භවත්හු පාසල් මාධ්‍ය සමාජයේ බර උසුලන්නෝය.
සිසු දරු දැරියෝ පාසල් මාධ්‍ය සමාජයේ නිර්මාණකරුවෝය.
දෙමාපියෝ පාසල් මාධ්‍ය සමාජයට රැකවරණය සලසන්නෝය.

ප්‍රකාශනය
පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන ජාතික වැඩසටහන
ජනමාධ්‍ය පර්යේෂණ අංශය
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
2024

## ‘පාසල් මාධ්‍ය සමාජ අත්පොත’ට එක් වූවෝ

**උපදේශකත්වය**

වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**අධීක්ෂණය**

එච්.එස්.කේ.ජේ.බණ්ඩාර
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

**සහය අධීක්ෂණය, සම්බන්ධීකරණය සහ පිටකවරය නිර්මාණය**

හර්ෂ බී. අබේකෝන්
සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන ජාතික වැඩසටහන

**ප්‍රධාන සංස්කාරක**

බන්දුල පී. දයාරත්න

**සම සංස්කාරකවරුන්**

මහාචාර්ය ටියුඩර් වීරසිංහ
මහාචාර්ය ධර්ම කීර්ති ශ්‍රී රංජන්
ශ්‍රීපාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

**සහය සම්බන්ධීකරණය**

ඉරුක්ෂි වික්‍රමසිංහ

**සහය**

පුබුදු චාමිකර
මිනෝලි හංසිකා
පියුමි ලියනගේ
ගයාත්‍රි මධුශිකා
බුද්ධි බස්නායක


**මුද්‍රණය**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව



© රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
2024 - දෙසැම්බර්



ISBN 978-624-6073-01-5



# පාසලින් පටන් ගනිමු.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ජනමාධ්‍ය පර්යේෂණ අංශය යටතේ ක්‍රියාත්මක වන, පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන ජාතික වැඩසටහනේ අරමුණ වන්නේ, දේශීය පාසල් තුළ මානව හිතවාදී හා ඵලදායී සන්නිවේදන මාධ්‍ය සංස්කෘතියක් ඇති කිරීමයි. ඒ සඳහා යොදා ගෙන ඇති වාහකය වන්නේ 'පාසල් මාධ්‍ය සමාජය'යි. එය පාසල්වල මෙතෙක් පැවති සාම්ප්‍රදායික පාසල් ශිෂ්‍ය සමිතියකට වඩා වැඩි කාර්ය භාරයක් ඉටු කරන්නකි.

'පාසල් මාධ්‍ය සමාජ අත්පොත' නම් වූ මෙම කුඩා පොත් පිංච ප්‍රකාශයට පත් කරනු ලබන්නේ, පාසල් මාධ්‍ය සමාජවල ක්‍රියාකාරිත්වය වඩාත් ඉහළ තලයකට නැංවීමට මග පෙන්වීම සඳහාය. 'පාසල් මාධ්‍ය සමාජ අත්පොත' පරිශීලනය කිරීමෙන් ඒ ඒ පාසල්වල මාධ්‍ය සමාජ සංවිධානය කරන්නේ කෙසේද? ඒ යටතේ වාර්ෂික සැලැස්මක් සකස් කරන්නේ කෙසේද? ඒ ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ශිෂ්‍ය සාමාජිකත්වය එක් කර ගන්නේ කෙසේද? පාසලේ මාධ්‍ය සමාජයේ ක්‍රියාකාරකම් සඳහා බාහිර ප්‍රජාවගේ සහාය ලබා ගන්නේ කෙසේද? ආදී වශයෙන් පුළුල් මග පෙන්වීමක් මෙම අත්පොතින් පාසල්වලට ලබා දෙයි.

වර්තමාන සමාජය මේ වන විටත් පුළුල් වශයෙන් මාධ්‍ය පරිභරණය කරන්නට පටන් ගෙන ඇත. ඒ නිසා සමාජයට මාධ්‍ය සාක්ෂරතාවෙන් පිරිපුන් ජනතාවක් අවශ්‍ය වේ. මාධ්‍ය සාක්ෂරතාවෙන් පිරිපුන් සමාජයක් නිර්මාණය කිරීමේ කාර්ය භාරය ආරම්භ වන්නේ, පාසල් දරුවන් තුළ ඒ පිළිබඳ නිපුණතා සංවර්ධනය කිරීමෙනි. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වෑයම වන්නේ ඒ සඳහා පාසල්වලට උදව් කිරීමයි. අවසානයේ එහි සමස්ත ප්‍රතිලාභය සමාජයටම ලැබෙන කිසිදු සැකයක් නැත.

ඉදිරි දශකය තුළ ලෝකයේ මාධ්‍ය පරිසරය කෙසේ වෙනස් වන්නේදැයි අපට නිශ්චය කළ නොහැකිය. එසේ වුවත් අපට සිතා ගත නොහැකි ආකාරයෙන් එම වෙනස සිදු වන බවට නම් කිසිදු සැකයක් නැත. පාසල් මාධ්‍ය සමාජයේ වගකීම වන්නේ, එම පුළුල් වන මාධ්‍ය පරිසරයට ගැළපෙන දරුවන් පිරිසක් පාසලින් සමාජ ගත කිරීමයි.

අලුත් අත්හදා බැලීම් කිරීමත්, නව නිර්මාණාත්මක ප්‍රවේශ කෙරෙහි යොමු වීමත් මගින් පාසලද, සමාජයද වෙනස් කරන්නට පාසල් මාධ්‍ය සමාජයට ඇති හැකියාව අවතක්සේරු කළ නොහැකිය. ඒ නිසා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සතුටට පත් වන්නේ, මෙම අත්පොත පරිස්සමින් පරිශීලනය කරමින්, ඒ ඒ පාසල්වල මාධ්‍ය සමාජවල කළමනාකරණය වඩාත් කාර්යක්ෂම තත්ත්වයකට පත් කර ගැනීමට, පාසල් ගුරු භවතුන් හා පාසල් මාධ්‍ය සමාජ සාමාජික දූ දරුවන් කටයුතු කරන ආකාරය දැකීමෙනි.

ඉදිරියේදී පාසල් මාධ්‍ය සමාජවල ක්‍රියාකාරිත්වය වඩාත් ඉහළ තලයකට ගෙන යෑම සඳහා අවශ්‍ය වන සෑම සහයක්ම - මග පෙන්වීමක්ද කරන්නට, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පසුබට නොවන බව දැන්වීමට කැමැත්තෙමි.

එච්.එස්.කේ.ජේ.බණ්ඩාර

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්



# කළ යුතු දේ - කළ හැකි දේ

සියලු දරුවන් නිල වශයෙන් ඉගෙනුම ආරම්භ කරන්නේ පාසලෙනි. එහිදී විධිමත් විෂය නිර්දේශය මෙන්ම නොවිධිමත් විෂය සමගාමී ක්‍රියාකාරකම් මගින් තමන්ගේ නිපුණතා සංවර්ධනය කර ගන්නට ඔවුන්ට අවකාශ ලැබේ. පාසල්වල ක්‍රියාත්මක වන මාධ්‍ය සමාජය යනු, පාසල් දරුවන්ට සිය සන්නිවේදන නිපුණතා සංවර්ධනය කර ගන්නට ලැබෙන හොඳ වේදිකාවකි.

'පාසල් මාධ්‍ය සමාජ අත්පොත' සම්පාදනය කර ඇත්තේ, පාසල් මාධ්‍ය සමාජය මගින් පාසල්වල කොතරම් දේ කළ යුතුද? කොතරම් දේ කළ හැකිද? යන්නට පිළිතුරක් ලබා දීම සඳහාය. පාසල් ශිෂ්‍ය සමිතියක කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා, මෙවැනි අත්පොතක් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රථම අවස්ථාව මෙයයි. එය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් සිදු වීම, එක් අතකට සොම්නසක් ඇති කරන සිද්ධියකි.

පාසල් ශිෂ්‍ය සමිතියක සාමාන්‍ය සංවිධාන සැලැස්මෙන් ඔබ්බට ගොස් නව සංවිධාන සැලැස්මක් හඳුන්වා දෙන්නට, පාසල් මාධ්‍ය සමාජ ක්‍රියා කර ඇති ආකාරය මේ පොත් පිංචෙන් මනාව පැහැදිලි වේ. එම නව සංවිධාන සැලැස්ම මගින් එහි ක්‍රියාකාරකයන්ට අඩු වෙහෙසකින් වැඩි දෙයක් කරන්නට අවකාශ සැලසෙන බව පැහැදිලි වේ.

පාසල් මාධ්‍ය සමාජ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම කොතරම් රසවත් හා ඵලදායී කාර්යයක්දැයි, මෙම පොත් පිංචෙන් මනාව හෙළිදරව් කර ඇත. එකිනෙකාගේ ඇල්මට ගැළපෙන පරිදි යම් ක්‍රියාකාරකමකට එක්වීමෙන් අගනා අත්දැකීමක් ලබා ගැනීමට, මෙම පොත් පිංච පාසල් මාධ්‍ය සමාජ සාමාජික දරු දැරියන්ට මග පෙන්වයි.

එසේම පාසල් මාධ්‍ය සමාජ භාරව කටයුතු කරන ගුරු භවතුන්ටද මෙය අගනා පිවිසුමකි. මෙය පොදු අත්පොතක් බැවින්, සියලු පාසල්වල මාධ්‍ය සමාජ කළමනාකරණය සඳහා එක් ආකෘතියක් යොදා ගැනීමට හැකිවීම විශාල ප්‍රයෝජනයකි.

මේ වන විටත් පාසල් මට්ටමින් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයක් වශයෙන්, සාමාන්‍ය පෙළ හා උසස් පෙළ පන්තිවල උගන්වනු ලබයි. එම පන්ති කාමර ඉගැන්වීමට අවශ්‍ය ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කර ගත හැක්කේ, පාසල් මාධ්‍ය සමාජයක් ඔස්සේය. ඒ නිසා පාසල් මාධ්‍ය සමාජයක් යනු හුදෙක් හුදෙකලා ශිෂ්‍ය සමිතියක් නොව, පාසල් අධ්‍යාපනයේ අනිවාර්ය අංගයක් ලෙස හැඳින්විය හැකිය. එසේ වුවත් සන්නිවේදනය විෂයය උගන්වන්නේ නැති පාසල්වලට වුවත්, මාධ්‍ය සමාජයක් පිහිටුවා ගන්නට කිසිදු බාධාවක් නැත.

එපමණක් නොව වඩාත් පුළුල් ලෙස කල්පනා කරන්නේ නම් ජ්‍යෙෂ්ඨ මාධ්‍ය සමාජය, කණිෂ්ඨ මාධ්‍ය සමාජය හා ප්‍රාථමික මාධ්‍ය සමාජය ආදී වශයෙන්, ඒ ඒ පන්ති මට්ටම් අනුව වර්ග කරනු ලැබූ මාධ්‍ය සමාජද පාසල්වල ආරම්භ කළ හැකිය. ඒ සඳහා අවශ්‍ය පොදු මග පෙන්වීම මෙම අත්පොතින් ගුරු භවතුන්ට ලබා ගත හැකිය.

මෙම අත්පොත ප්‍රකාශයට පත් කරන්නට කටයුතු කිරීම සම්බන්ධයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අපගේ ස්තුතිය පිරි නැමේ.

මහාචාර්ය ටියුඩර් වීරසිංහ / මහාචාර්ය කීර්ති ශ්‍රී රන්ජන්
ශ්‍රීපාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය



# පාසල් දරුවන්ට හොඳ වේදිකාවක්

'පාසල් මාධ්‍ය සමාජ' නිල වශයෙන් පාසල් පද්ධතියට හඳුන්වා දුන්නේ 1999 අග භාගයේදීය. එතැන් සිට මේ වන විට දශක දෙක හමාරක කාලයක් ගත වී ඇත. අද වන විට එය පාසල් තුළ ක්‍රියාත්මක වන, වඩාත් සක්‍රීය හා කාර්යක්ෂම ශිෂ්‍ය සංගමයක් බවට පත් වී ඇත. මෙම පොත් පිංච සම්පාදනය කොට ප්‍රකාශයට පත් කරනු ලබන්නේ, එම කාර්යය වඩාත් සාර්ථක කර ගන්නට අත හිත දීමක් වශයෙනි.

පාසල් මාධ්‍ය සමාජයේ සංවිධාන ව්‍යුහය තුළ සුවිශේෂීතා දෙකකි. එකක් නම් එයට අනුබද්ධව පිහිටුවන 'බාහිර කමිටුව'යි. එහි අරමුණ වන්නේ මාධ්‍ය සමාජය විසින් වාර්ෂිකව සැලසුම් කරන ක්‍රියාකාරකම් සඳහා, බාහිර අනුග්‍රාහකයන්ගේ සහය ලබා ගැනීමට නිල භාවයක් ඇති කර ගැනීමයි. පාසල් මාධ්‍ය සමාජයට අත හිත දෙන බාහිර පාර්ශ්වයක් ආරම්භයේදීම ලැයිස්තු ගත කර හඳුනා ගන්නට හැකි වීමෙන්, බොහෝ කටයුතු පහසු වෙයි. පාසල් මට්ටමින් ගැටලු ඇති කරන අරමුදල් සම්පාදනය සඳහා, මෙම බාහිර කමිටුවේ සහාය ලබා ගත හැකිය.

දෙවැනි විශේෂතාව නම් පාසල් මාධ්‍ය සමාජය යටතේ ස්ථාපිත කරනු ලබන ව්‍යාපෘති අටයි. ඒ මගින් පාසල් මාධ්‍ය සමාජයේ ක්‍රියාකාරකම්වලට අර්ථ කථනයක් ලබා දෙයි. පාසල් මාධ්‍ය සමාජයේ සාමාජික දරුවන්ට, තමන් කැමති ව්‍යාපෘතියකට සම්බන්ධ වී කටයුතු කරන්නට අවස්ථාවක් සැලසේ. මෙම ව්‍යාපෘති අට නිසා, පාසල් මාධ්‍ය සමාජයේ ක්‍රියාකාරිත්වයට වැඩි සාමාජික සංඛ්‍යාවකට එක් වන්නට අවස්ථාව සැලසේ. වැඩ කිරීමේ බලය ප්‍රධාන නිලධාරි මණ්ඩලය වෙත තබා ගැනීමට වඩා මෙය ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළකි.

එක් එක් ව්‍යාපෘතිය විසින් එක් ක්‍රියාකාරකමක් ක්‍රියාත්මක කළත්, ව්‍යාපෘති අටක් තුළ සුවිශේෂී ක්‍රියාකාරකම් අටක් පාසල තුළ ක්‍රියාත්මක කළ හැකිය. එක් මාසයකට එක් ක්‍රියාකාරකමක් අවම වශයෙන් ක්‍රියාත්මක කළ හැකිය. ඒ මගින් මාධ්‍ය සමාජය පාසල තුළ වඩාත් සක්‍රීය ශිෂ්‍ය සමිතියක් බවට පත් වේ.

එපමණක් නොව එක් ව්‍යාපෘතියකට පමණක් සුවිශේෂයෙන් සම්බන්ධ වී කටයුතු කිරීමට ඇති අවකාශය නිසා, දරුවන්ගේ සාමාන්‍ය අධ්‍යාපන කටයුතුවලට කිසිදු අපහසුතාවක් ඇති නොවේ. මක් නිසාද යත්, එක් ක්‍රියාකාරකමක් නිම කිරීමෙන් පසු අනෙක් අයට ඉඩ දීමට, මාධ්‍ය සමාජ සාමාජික දරුවන්ට අවස්ථාව ලැබෙන නිසාය.

පාසල් මාධ්‍ය සමාජ අත්පොතේ දැක්වෙන ව්‍යාපෘතිවලට අදාළ ක්‍රියාකාරකම්, පාසලක සංස්කෘතියේ අංගයක් බවට පත් වේ. උදාහරණයක් වශයෙන් 'පාසල් මාධ්‍ය සමාජ උළෙළ' පැවැත්වීම එක් ක්‍රියාකාරකමක් ලෙස ගත හොත්, එය සෑම වර්ෂයකම පවත්වන්නට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ සටහන් කර ගන්නට සිදු වේ.

ඉදිරියේදී පාසල් මාධ්‍ය සමාජවලට යා යුතු හා යා හැකි දිගු ගමනක් තිබේ. මෙම අත්පොත ලබා දෙන්නේ, එම ගමන ආරම්භ කිරීම සඳහා මගපෙන්වීමක් වශයෙනි. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවද සිය සාම්ප්‍රදායික රාජකාරි රාමුවෙන් පිටතට ගොස්, මේ ආකාරයෙන් බහුකාර්ය සැලැස්මකට යොමු වීමද සතුටට කරුණකි. එහි ප්‍රයෝජන අනාගතයේදී ලබන්නේ, පාසල් දරුවන් පමණක් නොවේ. සමස්ත සමාජයේම සන්නිවේදනය හා මාධ්‍ය නිපුණතා ඉහළ තලයකට ගෙන යන්නට, පාසල් මාධ්‍ය සමාජවලට හැකියාව ලැබෙන බවට කිසිදු සැකයක් නැත.

බන්දුල පී. දයාරත්න
ජාතික අධ්‍යාපන ආයතනයේ,
මාධ්‍ය අධ්‍යාපන ව්‍යාපෘතියේ හිටපු ප්‍රධානි



# 'පාසල් මාධ්‍ය සමාජ' ජාතික තලයට...

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ජනමාධ්‍ය පර්යේෂණ අංශය යටතේ 'පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන ජාතික වැඩසටහන' 2017දී ආරම්භ කරන ලද්දේ, දිගු කාලීන අපේක්ෂා සහිතවය. පාසල් මට්ටමින් ක්‍රියාත්මක වන මාධ්‍ය සමාජ, ජාතික තලයේ සංවිධාන ව්‍යුහයක් තුළ ස්ථාපිත කිරීම එම දිගු කාලීන අපේක්ෂාවයි. පාසල් මාධ්‍ය සමාජ කළමනාකරණය සඳහා විදුහල්පතීන්ටද, ගුරු භවතුන්ටද, සිසු දරු දැරියන්ටද මග පෙන්වීම සඳහා 'පාසල් මාධ්‍ය සමාජ අත්පොත' සම්පාදනය කොට, ප්‍රකාශයට පත් කරනු ලබන්නේ, එම දිගු කාලීන අපේක්ෂා ඉටු කර ගැනීමේ අභිලාෂයෙනි.

පසු ගිය අවුරුදු ගණනාව තුළ පාසල් මට්ටමින් පවත්වන ලද මාධ්‍ය හා සන්නිවේදන වැඩමුළු සංඛ්‍යාව අති විශාලය. පාසල් මාධ්‍ය සමාජ භාර ගුරු භවතුන් විශාල සංඛ්‍යාවකට, මෙම වැඩසටහන යටතේ කෙටි කාලීන පුහුණුව ලබා දීමටද හැකියාව ලැබී ඇත. එසේම පාසල්වල බිත්ති පුවත්පත් ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය පුවරු මේ වන දෙසීයකට ආසන්න සංඛ්‍යාවක් පාසල්වලට ලබා දීමට, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට හැකි වී ඇත. වාර්ෂිකව සන්නිවේදනය පිළිබඳ පොත් කට්ටලයක් පාසල්වලට පරිත්‍යාග කිරීමද වර්ෂ ගණනාවක්ම සිදු කර ඇත.

සුවිශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ, 'පාසල් මාධ්‍ය සමාජ පුවත්' යන නමින් අන්තර්ජාල සඟරාවක් ප්‍රකාශයට පත් කිරීමයි. එම සඟරාව සැලසුම් කිරීමේ කාරුණික අනුග්‍රහය ලබා දී ඇත්තේ, ළමයින්ගේ පුවත්පතක් වූ 'විජය' පුවත්පත විසිනි. මේ වන විට එම විද්‍යුත් සඟරාවේ කලාප හයක් ප්‍රකාශයට පත් කර ඇත.

'පාසල් මාධ්‍ය සමාජ අත්පොත' යනු මෙම ක්‍රියාකාරකම් අතරට එක් වන තවත් වැදගත් ක්‍රියාකාරකමකි. පාසල්වල මාධ්‍ය සමාජ සමග කරන ලද ගනුදෙනුවේදී හඳුනා ගත් වැදගත් කරුණක් වූයේ, එම ගුරු භවතුන්ට හා සාමාජික නිලධාරි මණ්ඩලයට පොදු මග පෙන්වීමක් කරන්නට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මැදිහත් වීමේ වැදගත් කමයි.

2000 වර්ෂයේදී ආරම්භක අත්පොතක් ජාතික අධ්‍යාපන ආයතනයේ මාධ්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය විසින් ප්‍රකාශයට පත් කර තිබුණි. එසේම සාමාන්‍ය පෙළ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පෙළපොතේද, පාසල් මාධ්‍ය සමාජ පිළිබඳ මග පෙන්වීම් කර ඇත. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු විසින් මෙම අත්පොත ප්‍රකාශයට පත් කරනු ලබන්නේ, එම මුල් මග පෙන්වීම්වල අන්තර්ගතය වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් නැවත සැලසුම් කරමිනි.

මෙම අත්පොත සම්පාදනය කළ බන්දුල පී. දයාරත්න මහතාටද, අත් පොත විමර්ශනය කර ප්‍රකාශනය සඳහා අනුමැතිය ලබා දුන් කොළඹ විශ්වවිද්‍යාලයේ, ශ්‍රීපාලි මණ්ඩපයේ හිටපු මණ්ඩපාධිපති මහාචාර්ය ටියුඩර් වීරසිංහ මහත්මාටත්, මහාචාර්ය කීර්ති ශ්‍රී රංජන් මහත්මාටත් සුවිශේෂී ස්තුතියක් පිරි නමමි. එසේම මෙම පොත් පිංච මුද්‍රණය සඳහා සැලසුම් කර දුන් සැලසිනේ ආයතනයටද, මුද්‍රණ කටයුතු මැනවින් ඉටු කළ රජයේ මුද්‍රණාලයේ කාර්ය මණ්ඩලයටද, මෙම කාර්යය සම්බන්ධීකරණය කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටද මගේ ස්තුතිය පිරි නැමේ.

එසේම මෙම කාර්ය සඳහා රාජකාරි සහය හා අනුමැතිය ලබා දුන් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්තුමන්ද, ජනමාධ්‍ය අමාත්‍යාශයේ ලේකම්තුමන්ද මේ මොහොතේ කෘතගුණ පූර්වකව සිහිපත් කරමි.

හර්ෂ බී. අබේකෝන්
සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන වැඩසටහන
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ
පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන වැඩසටහනේ
නිල ලාංඡනය

National Program to Promote
SCHOOL
MEDIA
CLUB
Department of Government Information
Sri - Lanka

# ඔබේ පාසලේත්
# මාධ්‍ය සමාජයක් පිහිටුවා ගන්න.

**- පාසල් මාධ්‍ය සමාජය පිහිටුවා ගන්නේ කවුරුන් විසින්ද?**

'පාසල් මාධ්‍ය සමාජය' යනු පාසලක ඇති විවිධ ශිෂ්‍ය සමිති අතරට එක් වූ තවත් එක් ශිෂ්‍ය සමිතියකි. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය උගන්වන පාසලක් නම්, 'මාධ්‍ය සමාජය' පිහිටුවීම සඳහා එම සිසු සිසුවියන්ට ප්‍රමුඛව කටයුතු කළ හැකිය. එහෙත් එම විෂයය නොමැති පාසලක වුවත් 'මාධ්‍ය සමාජයක්' පිහිටුවා ගත හැකිය. ඒ සඳහා පාසලේ ඉහළ පන්තිවල සිසු දරු දැරියන්ට මුල් විය හැකිය. 'මාධ්‍ය සමාජය භාර ගුරු භවතුන් ලෙස සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය උගන්වන හෝ වෙනත් විෂයයන් උගන්වන ගුරු භවතුන්ද එක් කර ගත හැකිය.

**- පාසල් මාධ්‍ය සමාජයේ අභ්‍යන්තර කමිටුව යනු කුමක්ද?**

පාසල් මාධ්‍ය සමාජය කළමනාකරණයට එක් වන පාසලේ අභ්‍යන්තර පිරිස අභ්‍යන්තර කමිටුවට අයත් වෙයි. එහි දී 'මාධ්‍ය සමාජයේ' උපදේශක මණ්ඩලයට විදුහල්පතිතුමා /තුමිය හා මාධ්‍ය සමාජය භාර ගුරු භවතුන් අයත් වෙයි. ඉන් පසු සිසු පිරිස අතරින් තෝරා ගන්නා නිලධාරි මණ්ඩලය අයත් වෙයි. මේ පිරිස 'පාසල් මාධ්‍ය සමාජයේ' අභ්‍යන්තර කමිටුවයි.

**- පාසල් මාධ්‍ය සමාජයේ බාහිර කමිටුව යනු කුමක්ද?**

ආදි ශිෂ්‍ය නියෝජිතයන්, මාධ්‍යවේදීන්, සාහිත්‍යකරුවන් හා වෙනත් ප්‍රජා නියෝජිතයන් මාධ්‍ය සමාජයේ බාහිර කමිටුවට අයත් වෙයි. ඔවුන් නම් කර ගනු ලබන්නේ පාසල් මාධ්‍ය සමාජය පිහිටුවා ගැනීමෙන් පසුවය. එම බාහිර නාම ලේඛනයට විදුහල්පතිතුමාගේ /තුමියගේ ලිඛිත අනුමැතිය අත්‍යවශ්‍යය. බාහිර කමිටුව පාසලේ මාධ්‍ය සමාජයට සම්බන්ධ වන්නේ, අවශ්‍ය අවස්ථාවල උදව් උපකාර කිරීමෙනි. ඒ නිසා 'මාධ්‍ය සමාජය' ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳව බාහිර කමිටුවේ සාමාජිකයන් සැම විටම දැනුවත් කර තැබිය යුතුය. එසේම බාහිර කමිටුවට ඇතුළත් කර ගන්නා සැම කෙනෙකුටම, ඒ බව ලිඛිතව දන්වා යවා ඔවුන්ගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතුය.

**- පාසල් මාධ්‍ය සමාජයේ ව්‍යාපෘති කුමකටද?**

ශිෂ්‍ය සමිතිවල නිලධාරි මණ්ඩලය ලෙස සලකනුයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හා කාරක සභාවයි. 'මාධ්‍ය සමාජයේ' ක්‍රියාකාරකම් භාර නිලධාරි මණ්ඩලයක් පත් කර ගැනීම, 'පාසල් මාධ්‍ය සමාජයේ ව්‍යාපෘති'වල අරමුණයි. මේ වන විට නිල වශයෙන් ව්‍යාපෘති අටක් පිළි ගෙන ඇත. ඒ අනුව ඒ ඒ ව්‍යාපෘතිය සඳහා සංවිධායක, නියෝජ්‍ය සංවිධායක තනතුරු සඳහා ශිෂ්‍ය නියෝජිතයන් පත් කර ගත යුතුය. තම ව්‍යාපෘතියට අවශ්‍ය සාමාජිකයන් ඒ ඒ අවස්ථාවල එක් කර ගැනීමට සංවිධායකට හැකිය. ඒ ඒ ව්‍යාපෘතිය යටතේ වර්ෂය තුළ ක්‍රියාත්මක කරන්නට අපේක්ෂා කරන වැඩසටහන් සැලසුම් කිරීම සංවිධායක හා නියෝජ්‍ය සංවිධායකගේ වගකීමයි.

**- පාසල් මාධ්‍ය සමාජයේ 'වාර්ෂික ලිත' සකසන්නේ කවුරුන් විසින්ද?**

මාධ්‍ය සමාජයට තෝරා ගන්නා ලද නිලධාරින්ගේ ප්‍රධානත්වයෙන් වාර්ෂික ලිත සම්පාදනය කළ යුතුය. ඒ සඳහා සභාපති හා ලේකම් විශේෂයෙන් මැදිහත් වී කටයුතු කළ යුතුය. මාධ්‍ය සමාජය භාර ගුරු භවතුන්ද, නිලධාරි මණ්ඩලයේ අනෙකුත් සාමාජික සාමාජිකාවන්ගේද යෝජනා හා අදහස් කෙරෙහි මෙහිදී සැලකිල්ල යොමු කළ යුතුය. මුලින්ම කළ යුත්තේ, ඒ ඒ ව්‍යාපෘති සඳහා පත් වූ සංවිධායක, නියෝජ්‍ය සංවිධායක හා ව්‍යාපෘති සාමාජික සාමාජිකාවන් විසින් ඉදිරිපත් කරන තමන්ගේ ව්‍යාපෘතියට අදාළ යෝජනා සැලසුම් ගැන සැලකිල්ල යොමු කිරීමයි. ඒවා එක් කිරීමෙන් ඉතා පහසුවෙන් වාර්ෂික ලිත සම්පාදනය කළ හැකිය. එක් ව්‍යාපෘතියක් විසින් වර්ෂයටම එක් ක්‍රියාකාරකමක් ක්‍රියාත්මක කළත්, අවුරුද්ද තුළ ප්‍රධාන ක්‍රියාකාරකම් අටක් ක්‍රියාත්මක වේ.

**- පාසල් මාධ්‍ය සමාජයේ මුදල් කටයුතු කරන්නේ කෙසේද?**

පාසල් මාධ්‍ය සමාජයටද, පාසලේ අනෙක් ශිෂ්‍ය සමිතිවල නියම අදාළ වේ. පාසල් මාධ්‍ය සමාජයේ මුදල් කටයුතුවල වගකීම භාණ්ඩාගාරික සතු වේ. එසේ වුවත් ඒ පිළිබඳව මාධ්‍ය සමාජය භාර ගුරු භවතුන් මැදිහත් වේ. පාසලේ විදුහල්පතිතුමා /තුමියගේ අධීක්ෂණය යටතේ මුදල් කටයුතු මෙහෙයවිය යුතුය.

# පාසල් මාධ්‍ය සමාජයේ
# සංවිධාන සැලැස්ම

**උපදේශක මණ්ඩලය**

විදුහල්පතිතුමා / තුමිය

මාධ්‍ය සමාජය භාර ගුරු භවතුන්

**බාහිර කමිටුව**

ආදි ශිෂ්‍ය

මාධ්‍යවේදී හා

වෙනත් සුබ

පතන්නන්

**ශිෂ්‍ය විධායක මණ්ඩලය**

සභාපති

නියෝජ්‍ය සභාපති

ලේකම්

නියෝජ්‍ය ලේකම්

භාණ්ඩාගාරික

නියෝජ්‍ය භාණ්ඩාගාරික

ප්‍රචාරක නිලධාරි / සංස්කාරක

ප්‍රධාන සංවිධායක

ව්‍යාපෘති සංවිධායකවරු 8

නියෝජ්‍ය ව්‍යාපෘති සංවිධායකවරු 8

**මාධ්‍ය සමාජයේ ව්‍යාපෘති**

මාධ්‍ය සමීක්ෂණ ව්‍යාපෘතිය

කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය

රස වින්දන ව්‍යාපෘතිය

නිර්මාණාත්මක ව්‍යාපෘතිය

ප්‍රජා සන්නිවේදන ව්‍යාපෘතිය

සාම සන්නිවේදන ව්‍යාපෘතිය

ආපදා හා අනතුරු සන්නිවේදන ව්‍යාපෘතිය

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ව්‍යාපෘතිය

**මාධ්‍ය සමීක්ෂණ ව්‍යාපෘතිය:** මාධ්‍යයට සම්බන්ධ විවිධ සරල දේ ගැන සොයා බලා වාර්තා සම්පාදනය කළ හැකිය. උදාහරණයක් වශයෙන් පාසලේ ළමුන්ගේ පුවත්පත් කියවීමේ පුරුද්ද පිළිබඳ සමීක්ෂණයක් කළ හැකිය. එසේත් නැතිනම් ගමේ නිවෙස්වල ගුවන් විදුලි ශ්‍රවණය පිළිබඳ සමීක්ෂණයක් කළ හැකිය. මෙවැනි සමීක්ෂණ කිරීම සඳහා මාධ්‍ය සමාජය භාර ගුරු මව් /පියවරුන්ගේ සහාය ලබා ගත යුතුය. මෙවැනි සමීක්ෂණයක් අවසානයේදී වාර්තාවක් සම්පාදනය කර, එය මාධ්‍ය සමාජයේ රැස්වීමකදී ඉදිරිපත් කළ යුතුය.

**කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය:** මාධ්‍ය සමාජයේ සාමාජික සාමාජිකාවන්ගේ මාධ්‍ය හා සන්නිවේදන කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක කළ හැකිය. උදාහරණයක් වශයෙන් කෙටි කතා ලිවීම, නිවේදනය, පරිගණක චිත්‍ර ශිල්පය, පෝස්ටර් නිර්මාණය, පුවත්පත් සංස්කරණය ආදී විවිධ කුසලතා සංවර්ධනය කිරීමේ එක් දින හෝ දින කිහිපයක හෝ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකිය.

**රස වින්දන ව්‍යාපෘතිය:** විවිධ කලාත්මක දේ රස විඳීමේ වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක කළ හැකිය. ගීත රස වින්දනය, නවකතාවක් විචාරය, කවි ගායනය ආදී වශයෙන් විවිධ තේමා මේ සඳහා තෝරා ගත හැකිය. වඩාත් උසස් දේ රස විඳින්නට පාසල් ප්‍රජාවට මග පෙන්වීම මෙහි අරමුණයි. මෙය ඉතාම රසවත් වැඩසටහනක් බවට පත් වේ. මේ සඳහා බාහිර සම්පත් දායකයන් මෙන්ම පාසලේම සංගීත කණ්ඩායම, චිත්‍ර ගුරුතුමා /ගුරුතුමිය ආදීන් යොදා ගත හැකිය.

**නිර්මාණාත්මක ව්‍යාපෘතිය:** විවිධ කලාත්මක දේ නිර්මාණය කිරීමට සාමාජික සාමාජිකාවන්ට හුරුවක් ලැබෙන ආකාරයේ වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක කළ හැකිය. නවකතා නිර්මාණය, කවි නිර්මාණය, පොත් පිට කවර නිර්මාණය, ගීත නිර්මාණය, පෝස්ටර් නිර්මාණය ආදී වශයෙනි. කෙටි නාට්‍යයක් නිර්මාණය කිරීමද, කෙටි නාට්‍ය තරග පැවැත්වීමද මෙම ව්‍යාපෘතිය යටතේ කළ හැකිය. එය පාසල තුළ පමණක් නොව කලාපීය වශයෙන් පාසල් අතර වුවද පැවැත්විය හැකිය.

**ප්‍රජා සන්නිවේදන ව්‍යාපෘතිය:** සාමාජික සාමාජිකාවන්ගේ දෙමාපියන්ට යම් තේමාවක් යටතේ දැනුමක් ලබා දිය හැකි විවිධ වැඩසටහන් මේ යටතේ ක්‍රියාත්මක කළ හැකිය. එසේම පාසලට පැමිණෙන්නන්ට පාසලේ ඒ ඒ අංශ සොයා ගැනීමට පහසු වන ලෙස නාම පුවරු සකස් කිරීමද, මෙම වැඩසටහනටම අයිතිය. ආරක්ෂිතව මහා මාර්ග භාවිතය, වාහන පැදවීම ආදිය පිළිබඳව වැඩිහිටියන්ට දැනුමක් ලබා දීමටද, මේ ව්‍යාපෘතිය යොදා ගත හැකිය. පාසල් සිනහ දිනය වැඩසටහනද ප්‍රජා සන්නිවේදන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ හැක්කකි.

**සාම සන්නිවේදන ව්‍යාපෘතිය:** අනෙකුත් පාසල් සමග හිතවත්කම් ඇති කර ගැනීම, වෙනත් ආගමික පාසල් සමග හුවමාරු වැඩ සටහන් සම්පාදනය, විවිධ ආගමික වැඩසටහන් පාසල තුළ පැවැත්වීම ආදිය මේ මගින් කළ හැකිය. උදාහරණයක් වශයෙන් සිංහල, දෙමළ, මුස්ලිම් දරුවන්ගෙන් සමන්විත එක් දින වැඩසටහනක් පාසලේදී පැවැත්විය හැකිය.

**ආපදා හා අනතුරු සන්නිවේදන ව්‍යාපෘතිය:** ආපදා හා අනතුරු සිදු විය හැකි වේලාව හෝ තැන හෝ එය සිදු වන ආකාරය හෝ පිළිබඳව පූර්ව විනිශ්චය කළ නොහැකිය. එසේ වුවත් පාසල තුළත්, එයින් පිටතත් විවිධ ආපදා හා අනතුරු ඇති වීම වළක්වා ගැනීමට පාසල් ප්‍රජාව දැනුවත් කිරීම හා ඒ පිළිබඳව සොයා බැලීම මේ ව්‍යාපෘතිය යටතේ කළ හැකිය. පාසල තුළම ආපදා සිදු විය හැකි ස්ථාන තිබිය හැකිය. ඒවා පිළිබඳව සොයා බලා ප්‍රතිකර්ම යෙදීමද මේ ව්‍යාපෘතියට අයත් වේ.

**මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා ව්‍යාපෘතිය:** අප ජීවත් වන මාධ්‍ය හා තොරතුරු සපිරි ලෝකය පිළිබඳව සාමාජික සාමාජිකාවන්ට නිසි දැනුමක් හා අවබෝධයක් ලබා ගත හැකි විවිධ දේශන, වැඩ මුළු, ප්‍රදර්ශන ආදිය පිටස්තර සම්පත් දායකයන්ගේ සහාය ඇතිව පාසල තුළ පැවැත්විය හැකිය. උදාහරණයක් වශයෙන් මාධ්‍ය විසින් භාෂාව පරිහරණය කරන ආකාරය පිළිබඳව සාකච්ඡා කළ හැකිය. එසේත් නැතිනම් මාධ්‍ය මගින් ඉදිරිපත් කරන දැන්වීම් පිළිබඳව සාකච්ඡා කළ හැකිය.

# පාසල් මාධ්‍ය සමාජ ලාංඡනය
# School Media Club Logo

School Media Club
Sri Lanka

මෙම ලාංඡනය 2000 වර්ෂයේදී ජාතික අධ්‍යාපන ආයතනයේ මාධ්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය විසින් සම්පාදනය කරන ලද්දකි. මේ සඳහා කැමති වර්ණ පසුබිමක් හා කැමති වර්ණයක් යොදා ගත හැකිය. එසේම පාසලේ අභිමතය පරිදි මාධ්‍ය සමාජයට විශේෂිත නාමයක් යොදා ගෙන මෙම ලාංඡනයට එක් කර ගත හැකිය.

**- පාසල් මාධ්‍ය සමාජ ලියා පදිංචි කරන්නේ කෙසේද?**

පාසල් මාධ්‍ය සමාජයේ නිලධාරීන් තෝරා ගැනීමෙන් පසුව හා වාර්ෂික ලිත සම්පාදනය කිරීමෙන් පසුව, එම රැස්වීම් වාර්තා පිටපත් සමග පහත සඳහන් ලිපිනයට එවීමෙන් පාසල් මාධ්‍ය සමාජ ලියාපදිංචි සහතිකය ලබා ගත හැකිය.

පාසල් මාධ්‍ය සමාජ ලියාපදිංචි කිරීම
පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන ජාතික වැඩසටහන
ජනමාධ්‍ය පර්යේෂණ අංශය,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
පොල්හේන්ගොඩ, කොළඹ 5

විස්තර සඳහා දුරකථන අංකය: 011 - 2 514 283

මානව හිතවාදී හා ඵලදායී පාසල් සන්නිවේදන මාධ්‍ය සංස්කෘතියක් කරා...

# පාසල් මාධ්‍ය සමාජ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (ආදර්ශ)

# School Media Club - Annual Calender (Model)

## පළමුවන වාරය

| | |
|---|---|
| ජනවාරි | 1. පාසල් මාධ්‍ය සමාජය පිහිටුවීම නිලධාරි මණ්ඩලය තෝරා ගැනීම |
| | 2. පාසල් ගුවන් විදුලි සේවා පුහුණු කඳවුරක් පැවැත්වීම, උදා ගුවන් විදුලි සේවා විකාශන සැලැස්මක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම |
| | 3. බිත්ති පුවත්පත සැකසීමේ පුහුණු කඳවුර |
| පෙබරවාරි | 4. නිශ්චල ඡායාරූප ශිල්පී පුහුණු කඳවුර |

## දෙවන වාරය

| | |
|---|---|
| මාර්තු | 5. නිශ්චල ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීම |
| | 6. පාසල් මාධ්‍ය සිනහ දිනය පැවැත්වීම |
| | 7. විචාරශීලී මාධ්‍ය ග්‍රාහකත්වය පදනම් කර ගත් මාධ්‍ය ශිෂ්‍ය පා ගමනක් පැවැත්වීම |
| මැයි | 8. යුනෙස්කෝ ලෝක පොත් දිනය පැවැත්වීම |
| ජුනි | 9. පොත් බැඳුම්කරණය හා අලුත්වැඩියාව පිළිබඳ පුහුණු වැඩසටහන ඇතුළත්ව ගෘහ පුස්තකාල වැඩසටහන හා කියවීමේ කඳවුර |
| ජුලි | 10. මාධ්‍ය වැඩහුරුව සතිය අධ්‍යාපන වැඩසටහන |

## තුන්වන වාරය

| | |
|---|---|
| සැප්තැම්බර් ඔක්තෝබර් | 11. පාසල් මාධ්‍ය අධ්‍යාපන සතිය හා පාසල් මාධ්‍ය අධ්‍යාපන ශිෂ්‍ය උළෙල සැලසුම් කිරීම |
| නොවැම්බර් | 12. පාසල් මාධ්‍ය අධ්‍යාපන සතිය හා පාසල් මාධ්‍ය අධ්‍යාපන ශිෂ්‍ය උළෙල පැවැත්වීම |
| | 13. මෙම වර්ෂයේ වාර්තාව සම්පාදනය කිරීම හා විදුහල්පතිතුමා /තුමිය වෙත ඉදිරිපත් කිරීම හා ඊළඟ වර්ෂය සඳහා නව නිලධාරි මණ්ඩලය පත් කිරීම |

**වර්ෂය පුරා අඛණ්ඩ වැඩසටහන්:** ගෘහස්ථ පුස්තකාල, අපේ උරුමය පාසල් මධ්‍යස්ථානය, බිත්ති පුවත්පත, උදා ගුවන් විදුලි විකාශය

(සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය 10 - 2014 පෙළ පොතේ 168 පිටුවෙනි.)

## 1. පාසල් මාධ්‍ය සමාජ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පෙර පිටුවේ දක්වා ඇත්තේ පාසල් මාධ්‍ය සමාජයක් සඳහා ක්‍රියාත්මක කළ හැකි ආදර්ශ ක්‍රියාකාරී සැලැස්මකි. පාසල් මාධ්‍ය සමාජයක් යටතේ ක්‍රියාත්මක කළ යුතු විවිධ ක්‍රියාකාරකම් රාශියක් මෙම කෘතියෙන් ඉදිරිපත් කර ඇත. තවත් බොහෝ ක්‍රියාකාරකම් පාසලකට නිර්මාණය කර ගත හැකිය.

ඒ අනුව තම පාසලේ මාධ්‍ය සමාජය සඳහා උචිත ක්‍රියාකාරකම් හඳුනා ගෙන ඒවා ඇතුළත් කොට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කර ගත හැකිය.

මුලින්ම ඒ ඒ ව්‍යාපෘතිවලින් යෝජනා ලබා ගැනීම ඉතාම වැදගත් වේ. ඒ ඒ ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කරන්නට අපේක්ෂා කරන්නේ මොනවාදැයි ඒ ඒ ව්‍යාපෘතිවලට පත් වන සංවිධාකයන් විසින් සාකච්ඡා මාර්ගයෙන් නිගමනය කළ යුතුය. ඒ අනුව අවම වශයෙන් ප්‍රධාන යෝජනා අටක් ලබා ගත හැකිය.

ඒ හැර මෙම ආදර්ශ සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම්ද සැලකිල්ලට ගත හැකිය. ඇත්තෙන්ම ඒවා දක්වා ඇත්තේ ඒ ඒ ව්‍යාපෘතිවල ක්‍රියාකාරකම් ලෙස යොදා ගත හැකි වන පරිදිය.

මෙම ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡා වට කිහිපයක් පවත්වා, මාධ්‍ය සමාජය භාර ගුරු භවතුන්ගේ හා විදුහල්පතිතුමාගේ / විදුහල්පතිතුමියගේ එකඟත්වය හා අනුමැතිය ඇතිව අවසාන සැලැස්ම සම්පාදනය කර ගත හැකිය.

වාර්ෂික සැලැස්ම සම්පාදනය කළ යුත්තේ ඒවාට සහභාගි වන සිසු දරු දැරියන්ගේ අනවශ්‍ය බරක් නොපැටවෙන ආකාරයෙනි. ඒ ඒ ව්‍යාපෘතිවලින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වලට නිලධාරි මණ්ඩලයේ සියල්ලෝම උපරිම සහාය ලබා දිය යුතුය.

වැඩසටහන් සඳහා මුදල් සම්පාදනය මෙහිදී ගැටලුවක් ලෙස පෙනෙනු ඇත. එහෙත් මාධ්‍ය සමාජයේ බාහිර කමිටු සාමාජිකයන් මගින් එම ගැටලුව පහසුවෙන් විසඳා ගත හැකි වනු ඇත. ඒ සඳහා අදාළ ක්‍රියාකාරකම්වල සම්පූර්ණ සැලැස්ම විදුහල්පතිතුමා / තුමිය මගින් ඔවුන්ට ඉදිරිපත් කළ යුතුය.

## 2. නිශ්චල ඡායාරූප ශිල්පී පුහුණු කඳවුර හා ප්‍රදර්ශනය

නිශ්චල ඡායාරූපකරණය පිළිබඳ ශිල්පීය කුසලතා දරුවන් තුළ සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. මෙය පවත්වන දිනයන් හා වේලාවන් පාසලට හා දරුවන්ට උචිත පරිදි සැලසුම් කර ගත හැකිය. උදාහරණයක් වශයෙන් සඳුදා දින සවස් වරුවේ පැයක් ගත හැකිය. එසේත් නැතිනම් සති අන්ත දින දෙකක් ගත හැකිය.

පුහුණුකරු ලෙස යොදා ගන්නේ කවුරුන්ද? යන්න පරිස්සමින් තීරණය කළ යුතුය. පුවත්පත්වල ප්‍රාදේශීය ඡායාරූප ශිල්පීන්ගේ සහාය මේ සඳහා ලබා ගත හැකිය. ඔවුන් මාධ්‍ය සමාජයේ බාහිර කමිටුවේ සාමාජිකයන් නම් එම ගැටලුව පහසුවෙන් විසඳිය හැකිය. එසේම පාසලට ආසන්නයේ ඇති ඡායාරූප ශාලාවක ඡායාරූප ශිල්පියෙකුද මේ සඳහා යොදා ගත හැකිය. එයින් ලැබෙන පහසුවක් නම් එම ඡායාරූප ශාලාව තුළ කටයුතු කෙරෙන ආකාරය අධ්‍යයනය කරන්නටද සිසුන්ට අවස්ථාව සලසා ගත හැකි වීමයි.

පුහුණුවට සහභාගි වන දරුවන්ගෙන් ඡායාරූපකරණය පිළිබඳ ආචාර ධර්ම සංග්‍රහයකට අත්සන් ලබා ගත යුතුය. එහි ප්‍රධාන අරමුණ වන්නේ ඡායාරූප අවභාවිතා කිරීමෙන් ඔවුන් වළක්වා ගැනීමයි.

පාසලට අලුතින් පැමිණි දරුවන්ගේ ඡායාරූප ගැනීමට අවස්ථාවක් විදුහල්පතිතුමාගේ / තුමියගේ අනුමැතිය ඇතිව යොදා ගත යුතුය. එම ඡායාරූප වැදගත් වන්නේ ඔවුන්ගේ දෙමාපියන්ටය. ඒ නිසා එම ඡායාරූප දෙමාපියන්ට අලෙවි කරන්නට හැකිය.

නිශ්චල ඡායාරූප ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් එම දරුවන්ගේ ඡායාරූපද ඇතුළත්ව දරුවන් විසින් නිදහස්ව ලබා ගත් වෙනත් ඡායාරූපද මුද්‍රණය කර ඉදිරිපත් කළ හැකිය. එය ඉතා පරිස්සමින් සැලසුම් කොට පැවැත්විය යුතු උළෙලකි. මෙහිදී ඡායාරූප මිල දී ගන්නට දෙමාපියන්ට හා අනෙකුත් නරඹන්නන්ට අවකාශ සලසා දිය යුතුය. එයින් මාධ්‍ය සමාජයට අරමුදලක් එක් වේ.

## 3. පාසල් සිනහ දිනය (School Smile Day) වැඩසටහන

ඕනෑම කෙනෙකුට සිනහසෙන්නට සාධක දෙකක් සම්පූර්ණ විය යුතුය. එකක් නම් සිනහසෙන්නට අවශ්‍ය මානසික සතුට තිබීමයි. දෙවැන්න නම් හොඳ දත් දෙපෙළක් සහිත මුවක් තිබීමයි. යුරෝපීය රටවල සිනහ දිනය අතිශයින් ප්‍රචලිත පාසල් හා ප්‍රජා වැඩසටහනකි. ඔවුන් අවධානය යොමු කර ඇත්තේ මුඛ සෞඛ්‍යය කෙරෙහි පමණය. එහෙත් ශ්‍රී ලංකාවේ පාසල් සිනහ දිනය වැඩසටහන සැලසුම් කරන ලද්දේ මුඛ සෞඛ්‍ය හා මානසික සෞඛ්‍ය තේමා කර ගනිමිනි.

පාසලක මාධ්‍ය සමාජයක් විසින් 'පාසල් සිනහ දිනය' වැඩසටහනක් සැලසුම් කිරීම ආරම්භ කළ යුත්තේ, ඒ පිළිබඳව ආසන්නතම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට මේ පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීමෙනි. පාසල් සිනහ දිනය වැඩසටහන පාසලක සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් දායකයන් සිටින්නේ එම කාර්යාලයෙහිය. එනම් දන්ත වෛද්‍යවරුන් හා මානසික වෛද්‍යවරුන්ය.

පාසල් සිනහ දිනය වැඩසටහන යටතේ පාසලේ දන්ත සායනයක් හා මානසික සෞඛ්‍ය වැඩමුළුවක් පැවැත්විය හැකිය. ඒ සඳහා අවශ්‍ය සම්පත් හා සම්පත් දායකයන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය විසින් සපයනු ඇත. ඒ වැඩසටහන ඔවුන් විසින් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරනු ඇත. පාසල් මාධ්‍ය සමාජය විසින් කළ යුත්තේ එම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය සහය ලබා දීමයි.

දන්ත සායනයට දෙමාපියන්ටද සහභාගි විය හැකිය. එසේම පාසලේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයටද සිය මුඛ සෞඛ්‍ය ගැටලු විසඳා ගන්නට මෙය හොඳම අවස්ථාවක් වනු ඇත. එපමණක් නොව පාසලේ සියලු දූ දරුවන්ට මෙයින් හොඳ අවකාශයක් සැලසේ.

දන්ත හා මානසික සෞඛ්‍යයට අදාළ නාට්‍ය, පෝස්ටර්, ගායනා, චිත්‍ර ආදිය මෙහිදී පාසල තුළ ප්‍රදර්ශනය කළ හැකිය. වඩාත් හොඳ නිර්මාණවලට ත්‍යාග පිරිනමන්නට වුවද පුළුවන. මේ සඳහා ඉතා හොඳ සංවිධානයක් අවශ්‍යය.

## 4. යුනෙස්කෝ ලෝක පොත් දිනය (Unesco World Book Day)

යුනෙස්කෝ ලෝක පොත් හා ප්‍රකාශන හිමිකම් දිනය යෙදෙන්නේ අප්‍රේල් 23 වන දිනටය. එදිනට පාසල්වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපහසු නිසා ඒ සඳහා මැයි මාසයේ සුදුසු දිනයක් යොදා ගත හැකිය. යුනෙස්කෝව විසින් පොත් හා ප්‍රකාශන හිමිකම් යන පද දෙකම භාවිත කළත්, මෙහිදී යොදා ගන්නේ පොත් යන පදය පමණි. පොත් යන පදය තුළම ප්‍රකාශන හිමිකම් යන අර්ථය ඇතුළත්ය. ඒ නිසා පාසල විසින් පවත්වන යුනෙස්කෝ ලෝක පොත් දිනයේදී පොත් ගැනද, ප්‍රකාශන හිමිකම් ගැනද වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකිය.

පොත් කියවීමේ කඳවුරක් පැවැත්වීම, යම් පොතක් පිළිබඳ විචාරාත්මක වැඩසටහනක් බාහිර සම්පත් දායකයෙකු යොදා ගෙන පැවැත්වීම, පොත් ප්‍රකාශකයෙකුගේ සහායෙන් පොත් ප්‍රදර්ශනයක් පාසල තුළ පැවැත්වීම, පාසලේ ගුරුභවතකුගේ හෝ දරුවෙකුගේ පොතක් දොරට වැඩීම, ප්‍රදේශයේ ලේඛකයෙකු /ලේඛිකාවක විසින් රචිත පොතක් දොරට වඩින්නට අවශ්‍ය පහසුකම් සලසා දීම ආදී වශයෙන් විවිධ දේ මේ ව්‍යාපෘතිය යටතේ කළ හැකිය.

උදාහරණයක් වශයෙන් පාසලේදී මඩොල් දූව පොත ගැන සාකච්ඡාවක් කරන්නේ නම් මඩොල් දූවේ චරිතවල ආකාරයට හැඳ පැළඳ ගත් දරුවන් කිහිප දෙනෙකුට මෙම වැඩසටහන වඩාත් අලංකාර කරන්නට පුළුවන. එසේත් නැතිනම් විවිධ පොත්වල ජනප්‍රිය චරිතවල ආකාරයට හැඳ පැළඳ ගත් දරුවන් කිහිප දෙනෙකුට මෙම වැඩසටහනේ යම් යම් ඉදිරිපත් කිරීම් කරන්නට පුළුවන.

විශේෂයෙන් ප්‍රකාශන හිමිකම් පිළිබඳ දේශනයක් බාහිර සම්පත් දායකයෙකු විසින් පැවැත්වීම මගින් ඒ පිළිබඳ දැනුම ලබා දිය හැකිය. ඒ සඳහා සුදුසු බාහිර සම්පත් දායකයෙකුට ආරාධනා කිරීමට මාධ්‍ය සමාජයේ බාහිර කමිටුව යොදා ගත හැකිය.

එපමණක් නොව හැකියාවක් ඇත්නම් පුස්කොළ පොත් ප්‍රදර්ශනයක්ද පාසල තුළ පැවැත්විය හැකිය. යුනෙස්කෝ ලෝක පොත් දිනයට සමගාමීව කලාපයේ පාසල් අතර සාහිත්‍ය තරගාවලියක් වුවද පවත්වා ත්‍යාග හා සහතික පත් පිරි නැමිය හැකිය.

# 5. අපේ උරුමය පාසල් මධ්‍යස්ථානය
(Our Herritage School Center)

පාසලකට අයත් උරුමය මට්ටම් තුනකින් හඳුනා ගත හැකිය.

1. පාසලේ උරුමය
2. ගමේ උරුමය
3. රටේ උරුමය

පාසලේ අපේ උරුමය මධ්‍යස්ථානය තුළ ගොඩ නැංවිය යුත්තේ පාසලේ උරුමය හා ගමේ උරුමයයි.

සාමාන්‍යයෙන් පාසලේ උරුමය ගැන පාසල්වල අවබෝධයක් හෝ හැඟීමක් ඇත්තේ ප්‍රධාන පෙළේ පාසල්වල පමණකි. අනෙක් පාසල්වලද උරුමයක් ඇතත්, ඒ ගැන සැලකිල්ලක් හෝ අවධානයක් නැත. එසේම පාසල අයත් වන ගම් ප්‍රදේශයේ ඇති උරුමය ගැන බොහෝ විට නොදන්නා තරම්ය.

ඒ නිසා පාසලේ උරුමය හා ගමේ උරුමය අධ්‍යයනය කිරීමේ වැඩසටහනක් ඒ සඳහා සුදුසු සම්පත් දායකයෙකුගේ මූලිකත්වයෙන් සැලසුම් කළ යුතුය. මෙම මධ්‍යස්ථානය පැවැත්වීම සඳහා අවම වශයෙන් පාසලේ පුස්තකාලයේ හෝ ඉඩකඩ ලබා ගත හැකිය. එසේ නැතිනම් පාසලේ විදුහල්පතිතුමාගේ /තුමියගේ අනුග්‍රහය යටතේ යම් තැනක් ඒ සඳහා තෝරා ගත යුතුය.

අපේ උරුමය මධ්‍යස්ථානයක් පාසල තුළ ආරම්භ කිරීම වහාම කළ නොහැක්කකි. ඒ සඳහා ඉතා දිගු කාලයක් ගත වේ. නමුත් යම් තැනකින් එය ආරම්භ කළ යුතුය. එවිට අනෙක් අය විසින් එය දිගින් දිගටම පවත්වා ගෙන යනු ඇත.

උදාහරණයක් වශයෙන් පාසලේ ආදි ශිෂ්‍යයන් පිළිබඳ වගතුග, පාසලේ ආදි ගුරු භවතුන් පිළිබඳ හා ආදි විදුහල්පතීන් පිළිබඳ වගතුග රැස් කළ යුතුය. ඒවා ප්‍රදර්ශනය කිරීමේ ක්‍රමයක් කල්පනා කළ යුතුය. ඔවුන්ගේ ඡායාරූප රැස් කර ගත යුතුය. ඔවුන්ගේ වත ගොත ලේඛන ගත කළ යුතුය.

ගමේද එවැනි උරුමයක් ඇත. මේ නිසා පාසලේ අපේ උරුමය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම ඉතාම රසවත් වැඩකි.

# 6. පාසල් වැඩහුරුව අධ්‍යාපන සතිය (School Work Experience Education Week - SWEEW)

යම් ආයතනයකට සතියක කාලයක් ගොස් එහි වැඩ කරමින් එහි මාධ්‍ය හා සන්නිවේදන කටයුතු පිළිබඳව හැදෑරීම මෙහිදී සිදු වේ. මේ සඳහා අදාළ සතිය තුළ එම කාර්යාලයේ සාමාන්‍ය රාජකාරි කාලය තුළ දරු දැරියන් රැඳී සිටිය යුතුය.

පාසල් වැඩහුරුව අධ්‍යාපන සතිය සඳහා තෝරා ගන්නේ පාසලේ 10 හා 12 ශ්‍රේණිවල දරු දැරියන්ගෙන් කැමති අය පමණි. මෙය අනිවාර්ය නොවේ.

මේ පිළිබඳව පාසලේ විදුහල්පතිතුමාගේ /තුමියගේ පූර්ව කැමැත්ත ලබා ගත යුතුය. කුමන කාර්යාලයකට හෝ කාර්යාල කිහිපයකට හෝ දරුවන් යවන්නේදැයි මාධ්‍ය සමාජය භාර ගුරු භවතුන් විසින් මුලින්ම අධ්‍යයනය කළ යුතුය. එම කාර්යාලවල ප්‍රධානීන් සමග නිල නොවන සාකච්ඡා පවත්වා ඔවුන්ගේ කැමැත්ත දැන ගත යුතුය. කාර්යාල ප්‍රධානීන්ගේ කැමැත්ත විදුහල්පතිතුමන්ට / තුමියන්ට දන්වා ඒ පිළිබඳ ලිඛිත වාර්තාවක් සම්පාදනය කිරීම මාධ්‍ය සමාජය භාර ගුරු භවතුන්ගේ කාර්යයකි.

දෙවනුව කළ යුත්තේ මෙම වැඩසටහනට සහභාගි වීමට කැමැත්ත පළ කළ දරුවන්ගේ දෙමාපියන් සමග සාකච්ඡාවක් පැවැත්වීමයි. ඔවුන්ගේ කැමැත්තද මෙයට අවශ්‍යය. එසේම අදාළ සතිය තුළ දරුවන් එම කාර්යාලයට ගෙන යැමේ හා සවස ඔවුන් ඒ ඒ කාර්යාලවලින් භාර ගැනීමේ වගකීම දෙමාපියන්ට පැවරිය යුතුයි.

තුන්වනුව කළ යුත්තේ කාර්යාල ප්‍රධානීන්ගේ කැමැත්ත ලිඛිතව ලබා ගැනීමයි. එම ලිඛිත කැමැත්තද, දෙමාපියන්ගේ ලිඛිත කැමැත්තද, දරුවන්ගේ ලිඛිත කැමැත්තද ඇතුළත් කොට පාසල් වැඩහුරුව අධ්‍යාපන සතිය පිළිබඳ යෝජනා පත්‍රය විදුහල්පතිතුමා /තුමිය මගින් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර අනුමැතිය ලිඛිතව ලබා ගැනීම අත්‍යවශ්‍යය.

හතර වෙනුව කළ යුත්තේ එම වැඩසටහනට සහභාගි වන දරුවන් සඳහා දින පහට රක්ෂණ ආවරණයක් ලබා ගැනීමයි. ඒ සඳහා වූ දායක

මුදල් මාධ්‍ය සමාජයේ අරමුදලින් හෝ විදුහල්පතිතුමාගේ /තුමියගේ අභිමතය පරිදි පාසල් අරමුදලින් හෝ එසේත් නැතිනම් දෙමාපියන් විසින් හෝ ගෙවිය යුතුය. දරුවන් කාර්යාලය යා යුත්තේ පාසලේ නිල ඇඳුමිනි.

### දරුවන් විසින් අත්සන් කළ යුතු ප්‍රතිඥාව

.................................................................................................

විද්‍යාලයේ 10 / 12 ශ්‍රේණියේ ඉගෙන ගන්නා ...................................... නම් වූ මම පාසල් වැඩහුරුව අධ්‍යාපන සතිය වැඩසටහනට සහභාගි වන්නේ මගේ කැමැත්තෙන් බවත්, එම වැඩසටහනින් මට ලැබෙන ප්‍රයෝජනය පිළිබඳව අවබෝධයෙන් යුතුව අඛණ්ඩව හා නිසි පරිදි එම වැඩසටහනට සහභාගි වන බවත්, විශ්වාසවන්තව හා වගකීමෙන් යුතුව කටයුතු කරන බවටත් පොරොන්දු වෙමි.

දිනයඃ අත්සනඃ

### දෙමාපියන් විසින් අත්සන් කළ යුතු ප්‍රතිඥාව

මගේ දරුවා වන ................................................................ විද්‍යාලයේ 10 / 12 ශ්‍රේණියේ ඉගෙන ගන්නා ............................................... නම් මගේ දරුවා පාසල් වැඩහුරුව අධ්‍යාපන වැඩසටහනට සහභාගි වීම සම්බන්ධයෙන් මගේ කැමැත්ත හා එකඟත්වය ප්‍රකාශ කරමි. එසේම දරුවා අදාළ ස්ථානයට ගෙන යෑම සහ කැඳවා ගෙන ඒමේ වගකීම මා න් භාර ගන්නා බවත් පොරොන්දු වෙමි.

දිනයඃ අත්සනඃ

පාසල් වැඩහුරුව අධ්‍යාපන සතිය සඳහා කුමන කාර්යාල යෝග්‍යදැයි නිශ්චය කළ නොහැකිය. පාසල්වල අත්දැකීම අනුව පහත සඳහන් කාර්යාල යෝග්‍ය බව පැහැදිලිය.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල
- පොලිස් ස්ථාන
- තැපැල් කාර්යාල

- කලාප අධ්‍යාපන කාර්යාල
- සර්වෝදය
- සණස
- සියලු බැංකු
- සමෘද්ධි බැංකු

පාසල් වැඩහුරුව අධ්‍යාපන සතිය වැඩසටහනට සහභාගි දරුවන් දිනපොතක් පවත්වා ගෙන යා යුතුය. දිනපතා තමන්ගේ සහභාගිත්වයට අදාළව තොරතුරු එම සටහන් පොතේ ඇතුළත් කළ යුතුය.

පාසල් මාධ්‍ය සමාජය භාර ගුරු භවතුන්ද, විදුහල්පතිතුමා / තුමියද නිති පතා ඒ ඒ කාර්යස්ථාන වෙත ගොස් ඒවා අධීක්ෂණය කළ යුතුය.

ඒ හැර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ හා කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන්ටද මෙම ස්ථාන අධීක්ෂණය සඳහා ආරාධනා කළ යුතුය.

දින පහ අවසාන වූ පසු සහභාගි වූ දරුවන් වෙනුවෙන් රැස්වීමක් පැවැත්වීම ඒ ඒ කාර්යාලවල වගකීමකි. ඒ අවස්ථාවට පාසලේ ගුරු භවතුන්ගේ සහභාගිත්වය අතිශයින් වැදගත්ය. එසේම ඒ රැස්වීමේදී ඔවුන්ගේ සහභාගිත්වය පිළිබඳව සහතිකයක් එම කාර්යාලයේ ප්‍රධානියාගේ අත්සනින් යුක්තව ප්‍රදානය කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය කටයුතු පාසල් මාධ්‍ය සමාජය භාර ගුරු භවතුන් විසින් සංවිධානය කර තිබිය යුතුය.

වැඩසටහන අවසාන වූ පසු ඊ ළඟ සතියේදී ඒ ඒ දරුවන් විසින් තමන්ගේ අත්දැකීම් පාසල තුළ ඉහළ පන්තිවල අනෙක් දරුවන්ට ඉදිරිපත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. සෑම සහභාගිකයකුම තමන්ගේ අත්දැකීම් ඇතුළත් වාර්තාවක් සම්පාදනය කළ යුතු අතර, ඒවා එක් කොට සමස්ත වාර්තාවක් සකසා විදුහල්පතිතුමා / තුමිය වෙත ඉදිරිපත් කළ යුතුය.

එසේම මේ වාර්තාවල සම්පිණ්ඩනයක් ප්‍රාදේශීය හා කලාප අධ්‍යාපන කාර්යාල ප්‍රධානීන් වෙත යැවිය යුතුය. එසේම ඒ ඒ කාර්යාල ප්‍රධානීන්ට ස්තුතිය පළ කිරීමේ ලිපියක්ද යැවීම වගකීමකි.

## 7. යුනෙස්කෝ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා දිනය (Unesco Media & Information Literacy Day)

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතා දිනය ප්‍රකාශයට පත් කරන ලද්දේ යුනෙස්කෝව විසිනි. එය වාර්ෂිකව ලෝකය පුරා පවත්වනු ලබන වැඩසටහනකි. මේ සඳහා යුනෙස්කෝව යෝජනා කරන්නේ සෑම වර්ෂයකම ඔක්තෝබර් 24-31 සතියයි. එහෙත් ප්‍රායෝගික පහසුව සලකා පාසල්වල මෙම වැඩසටහන සතියක් නොව දිනයක් ලෙස ක්‍රියාත්මක කිරීම පහසුය.

යුනෙස්කෝවේ අරමුණ වන්නේ ලෝකය පුරා තරුණ පිරිස තුළ මාධ්‍ය හා තොරතුරු ප්‍රවේශ පිළිබඳ විචාරාත්මක ආකල්ප පෝෂණය කිරීමයි. නූතනය වන විට සමාජගත වන තොරතුරු ප්‍රමාණය බහුලය. එය කළමනාකරණය කර ගැනීමද අපහසු තරම්ය එපමණක් නොව සමාජයට වැදගත් මෙන්ම නොවැදගත් හා නිස්සාර තොරතුරුද ගලා එමින් පවතී. මේ නිසා මාධ්‍ය හා තොරතුරු දෙස විචාරාත්මකව බැලීමටත්, තම තමන්ගේ ජීවිතවල යහපත සඳහා මාධ්‍ය හා තොරතුරු හසුරුවා ගැනීමටත් පාසල් දරුවන්ට ඉගැන්විය යුතුය.

මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පිළිබඳ පාසල් වැඩසටහනට පහත සඳහන් අංග ඇතුළත් කළ හැකිය.

- මාධ්‍ය හා තොරතුරු පිළිබඳ රචනා තරගයක් පැවැත්වීම
- මාධ්‍ය හා තොරතුරු පාලනය නොකළ යුතුය යන මැයෙන් විවාද තරගයක් පැවැත්වීම
- මාධ්‍ය හා තොරතුරු විසින් පුද්ගලයා ආක්‍රමණය කර තිබෙන බව දැක්වෙන චිත්‍ර නිර්මාණ තරගයක් පැවැත්වීම
- ආරාධිතයෙකු ලවා නූතන මාධ්‍ය හා තොරතුරු ලෝකය පිළිබඳ දේශනයක් පැවැත්වීම

මේ ආකාරයෙන් විවිධ වැඩසටහන් යුනෙස්කෝ මාධ්‍ය හා තොරතුරු දිනය සැමරීම සඳහා ක්‍රියාත්මක කළ හැකිය. ඒ පිළිබඳව මාධ්‍ය සමාජය භාර ගුරු භවතුන් හා නිලධාරි මණ්ඩලය සාකච්ඡා කොට තීරණ ගත යුතුය.

# 8. පාසල් උදා ගුවන් විදුලි සේවය
(School Morning Radio Service)

පාසල් උදා ගුවන් විදුලි විකාශයක් කළ යුත්තේ පෙ.ව. 6.30 සිට 7.30ට උදය රැස්වීම පැවැත්වෙන වේලාව දක්වාය. එහි අවම කාලය පැයකි. මෙය දිනපතා උදය ක්‍රියාත්මක කළ යුත්තකි. මෙය සඟරා වැඩසටහනක් ලෙස සැලසුම් කළ යුතුය.

පළමුව දක්ෂ ලෙස කතා කරන්නට හැකියාව ඇති දරුවන් මේ සඳහා තෝරා ගත යුතුය. පළමුව කළ යුත්තේ ඔවුන්ට දින කිහිපයක අඛණ්ඩ හෝ කඩින් කඩ හෝ පුහුණුවක් ලබා දීමයි. මෙම පුහුණු කාලයේදී දරුවන්ට තමන්ගේ කට හඬ පුහුණු කර ගන්නට අවස්ථාව සලසා දිය යුතුය. ඒ සඳහා ගුවන් විදුලි මාධ්‍ය පිළිබඳ නිපුණතාවක් ඇති පුහුණු කරුවෙකු යොදා ගත යුතුය.

දෙවනුව ගුවන් විදුලි සඟරා වැඩසටහනක් සැලසුම් කිරීම පිළිබඳව පුහුණුලාභීන්ට හොඳ පුහුණුවක් ලබා දිය යුතුය. ඒ ආකාරයෙන් තමන්ගේ පාසලට උචිත ආකර්ශනීය සඟරා වැඩසටහනක් සැලසුම් කර ගත හැකිය.

තුන් වැනුව පාසල් උදා ගුවන් විදුලි සේවය සඳහා පන්ති මට්ටමින් වාර්තා කරුවන් නම් කර ගත යුතුය. ඔවුන්ගේ කාර්යය වන්නේ තමන්ගේ පන්තියේ ඇති විශේෂ තොරතුරු ගුවන් විදුලි ඒකකයට නිරතුරුවම ලබා දීමයි.

හතර වැනුව සතියේ දින පහ සඳහා ගුවන් විදුලි සේවා කණ්ඩායම් පහක් සූදානම් කළ යුතුය. මෙම කණ්ඩායම් පහ භාරව ගුරු භවතුන් දෙදෙනෙකු යොදා ගත යුතුය. ඒ ඒ කණ්ඩායමට ඉහළ පන්තිවල සිට පහළ පන්තිවලට බෙදී යන සේ තෝරා ගත් පුහුණුලාභීන් අවම වශයෙන් පස් දෙනා බැගින් සම්බන්ධ කළ යුතුය. ඒ අනුව සමස්ත කණ්ඩායම විසි පහක් වේ. පාසලේ වැඩි ළමුන් සංඛ්‍යාවක් සිටින්නේ නම් කණ්ඩායමේ තරම වැඩි කළ හැකිය.

ඒ ඒ දිනවල උදා ගුවන් විකාශයට සුදුසු නමක් යොදා ගත හැකිය. උදාහරණ වශයෙන් සඳුදා රන්තරු, අඟහරුවාදා මිණිපහණ, බදාදා රන් කැකුළු ආදී වශයෙන් විය හැකිය.

ඒ ඒ දිනවලට නියමිත ශිෂ්‍ය කණ්ඩායමේ ප්‍රධානියා නිෂ්පාදක ලෙස නම් කළ යුතුය. එවිට සෑම දිනයකම උදා විකාශය භාර නිෂ්පාදකයෙකු සිටියි. ඒ හැර සහය නිෂ්පාදකවරුන් දෙදෙනෙකු හෝ තුන් දෙනෙකු පත් කළ හැකිය නිවේදකවරුන් හා ඉදිරිපත් කරන්නන් නම් කිරීම ඉන් පසු කළ යුතුය. මේ ආකාරයෙන් ඒ ඒ දිනවල නිෂ්පාදක කණ්ඩායමට දහ දෙනෙක් පමණ ඇතුළත් විය හැකිය.

ඒ ඒ දිනවල උදා සේවය මගින් කතා, නාට්‍ය, ප්‍රවෘත්ති, සාකච්ඡා, නිවේදන, උදා විකාශය අවසන් විය යුත්තේ ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමෙනි. ඒ සඳහා උදා විකාශයට සම්බන්ධව ප්‍රවෘත්ති පිටපතක් සම්පාදනය කරන කණ්ඩායමක් වෙනම කටයුතු කළ යුතුය. ඔවුන් දිනපතා උදය ප්‍රවෘත්ති පිටපත සම්පාදනය ආරම්භ කළ යුත්තේ පෙර දින ලබා ගත් ප්‍රවෘත්ති යොදා ගනිමිනි. තවත් ප්‍රවෘත්ති උදයම ලැබෙන්නට පුළුවන. මේ සඳහා ප්‍රවෘත්ති සම්පාදක කණ්ඩායම් පහක් යොදා ගැනීමෙන් වඩාත් පහසුවක් ලැබේ. එපමණක් නොව වැඩි දෙනෙකුට මේ පිළිබඳ අත්දැකීමක් ලබා ගන්නට අවස්ථාව සැලසේ.

දිනපතා ප්‍රවෘත්ති පිටපත ඒ ඒ දිනවල ප්‍රවෘත්ති විකාශනය භාර ගුරුතුමිය / ගුරුතුමා විසින් ලිඛිතව අත්සන් තබා අනුමත කළ යුතුය. මේ සඳහා විධිමත් සැලැස්මක් විදුහල්පතිතුමාගේ / තුමියගේ අනුමැතිය ඇතිව සකස් කර ගත යුතුය.

ප්‍රවෘත්ති පිටපත සම්පාදනය කිරීමත්, ප්‍රවෘත්ති පිටපත වාචිකව ඉදිරිපත් කිරීමත් කාර්යයන් දෙකකි. ඒ සඳහා ප්‍රවෘත්ති ඉදිරිපත් කරන්නන් කණ්ඩායමක් පුහුණු කර ගත යුතුය.

උදා ගුවන් විදුලි සේවය ඉතා සංකීර්ණ වැඩසටහනකි. ඒ නිසා එය ඉතාම පරිස්සමින් සැලසුම් කළ යුතුය. සතියේ දින පහේ උදා ගුවන් විදුලි විකාශය භාරව ගුරු කණ්ඩායම් පහක් යොදවා ගත හැකි විය යුතුය. එවිට ඉතාම පහසුවෙන් උදා ගුවන් විදුලි විකාශය සාර්ථකව ක්‍රියාත්මක කළ හැකිය.

ඒ ඒ දිනවල උදා ගුවන් විදුලි විකාශය ආරම්භ කරන්නට පෙර එහි ලිඛිත සැලැස්මක් පොතක තිබිය යුතුය. එසේම එය නිම වූ පසුව එම සැලැස්මට අවශ්‍ය සටහන් තැබිය යුතුය. එම වාර්තාව ඒ ඒ දිනවල විකාශය භාර ගුරු භවතා විසින් අත්සන් කළ යුතුය.

# 9. බිත්ති පුවත්පත්
## (School Wall Newspapers)

බිත්ති පුවත්පත් සම්පාදනය පාසල් මාධ්‍ය සමාජයේ ප්‍රධානම ක්‍රියාකාරකමකි. බිත්ති පුවත්පතක් යනු නිර්මාණ පුවරුවක් නොවේ. එය නිසැකවම සැලසුම් කොට නිර්මාණය කරන ලද පුවත්පතකි. එය බිත්තියේ ප්‍රදර්ශනය කරන නිසා බිත්ති පුවත්පත යන නමින් හඳුන්වයි.

පාසල් බිත්ති පුවත් පතක් සම්පාදනය කිරීම සඳහා පහත දැක්වෙන මග පෙන්වීම ගැන සැලකිලිමත් වන්න.

1. බිත්ති පුවත්පත සෑම සඳුදා දිනයකම ප්‍රදර්ශන කළ යුතුය. ඒ අනුව මාසයකට හතරකි. බිත්ති පුවත්පත සම්පාදනය කිරීම සඳහා තෝරා ගන්නා සම්පාදක මණ්ඩල හතරක් මගින් මෙය වඩාත් පහසුවෙන් සම්පාදනය කළ හැකිය. මක් නිසාද යත් සම්පාදක මණ්ඩල හතරක් යෙදවීමෙන් එක් මණ්ඩලයකට බිත්ති පුවත්පත නිර්මාණය කරන්නට සිදු වන්නේ මාසයකට එකකි. එසේම එම කණ්ඩායම් සංඛ්‍යාව අටක් කළ හොත් එක් කණ්ඩායමකට මාස දෙකකට වරක් බිත්ති පුවත්පතක් සම්පාදනය කරන්නට හැකි වේ. එය පහසුය.

2. බිත්ති පුවත්පත සම්පාදක මණ්ඩලයට 7 - 10 අතර සංඛ්‍යාවක් එක් කර ගැනීම යෝග්‍යය. ඔවුන්ගෙන් එක් අයෙක් ප්‍රධාන සංස්කාරකය. තවත් කෙනෙක් සහාය සංස්කාරකය. තවත් එක් අයෙක් හෝ දෙදෙනෙක් පිටු සැලසුම් ශිල්පීහුය. තවත් දෙදෙනෙක් ප්‍රවෘත්ති ලේඛකයෝය. එක් අයෙක් ඡායාරූප ශිල්පියෙකි. එවිට මුළු සංඛ්‍යාව හතකි. මෙම සංඛ්‍යාව අවශ්‍ය පරිදි වෙනස් කර ගත හැකිය.

3. එක් එක් කණ්ඩායම සඳහා ගුරු භවතුන් දෙදෙනෙක්වත් එක් කර ගත හැකි නම් වඩාත් අගනේය. එයින් විශාල පහසුවක්ද ලැබේ. ඒ ගුරු භවතුන්ගේ මග පෙන්වීම අනුව ඒ ඒ පුවත්පත සම්පාදනය කළ හැකිය

4. පොදුවේ බිත්ති පුවත්පතට ගැළපෙන නමක් යොදා ගන්න. සියලු පුවත්පත් නම කළ යුත්තේ ඒ එක නමිනි. වෙනස් වන්නේ කාණ්ඩය හා කලාපයයි. කාණ්ඩය යනු යම් වර්ෂයක කාල සීමාවයි. කලාපය යනු ඒ ඒ සතියට අදාළ ප්‍රකාශන අංකයයි. ඒ ඒ කලාපයට සම්පාදනය කරන

කණ්ඩායමේ නම් බිත්ති පුවත්පතේ යෝග්‍ය ස්ථානයක සඳහන් කළ යුතුය.

5. මාධ්‍ය සමාජයේ ප්‍රකාශනයක් බවත්, කාණ්ඩය හා කලාපයද, සම්පාදක මණ්ඩලයද සඳහන් කළ යුතුය.

6. බිත්ති පුවත්පත සඳහා බ්‍රිස්ටල් බෝඩ් එකක් හෝ බොක්ස් බෝඩ් එකක් අවම වශයෙන් ප්‍රමාණවත්ය. එසේ නැතිනම් බ්‍රිස්ටල් බොඩ් දෙකක් එකට යා කර අලවා ලොකු කර ගත හැකිය. බිත්ති පුවත්පත සඳහා ඇති පුවරුවේ හැඩයට ගැළපෙන ලෙස බෝඩ් එක සකස් කර ගත යුතුය.

7. බිත්ති පුවත්පත සැලසුම් කිරීමේදී ක්‍රම දෙකක් තෝරා ගත හැකිය. එකක් නම් ගණිත විද්‍යාත්මකව තීරු සකස් කර - පේළි සකස් කර අන්තර්ගතය එහි ඇතුළත් කිරීමයි. එසේත් නැතිනම් නිදහස් ආරක් යොදා ගනිමින්, පිටුව තුළ අන්තර්ගතය ඉදිරිපත් කිරීමයි. මෙයින් දෙවැනි ක්‍රමය වඩාත් පහසුය. මක් නිසාද යත් නිදහස් ආර යොදා ගැනීමේදී කොතනක හෝ සිදු වන දෝෂයක් නොපෙනෙන නිසාය. නිසි ලෙස තීරු හා පේළි අනු පිටුව සැලසුම් කිරීමේදී ඉතා සුළු දෝෂයක් වුවත් මතු වී පෙනේ.

8. බිත්තියේ රැඳ වූ පුවත්පත ඉදිරියේ සිට කියවිය හැකි තරමට අකුරු ලොකු විය යුතුය. සණකම විය යුතුය. ඒ නිසා වඩාත් යෝග්‍ය වන්නේ හීන් තුඩක් සහිත ප්ලැටිග්නම් පෑන්වලින් ලිවීමයි. කාබන් පෑන්වලින් ලියන අකුරු බිත්ති පුවත්පත්වලට ප්‍රමාණවත් නැත.

9. බිත්ති පුවත්පතේ ඉහළින්ම දැක්විය යුත්තේ ප්‍රධාන ප්‍රවෘත්තියයි. ඉන් පසුව අනු ප්‍රවෘත්ති දැක්විය හැකිය. පාසලේ පන්ති මට්ටමේ ප්‍රවෘත්තිද ඇතුළත් කළ හැකිය. ඒ හැර ඒ ඒ පන්තිවල නිර්මාණශීලී දරුවන්ගෙන් ලබා ගත් කවි, කතා, චිත්‍ර, තේරවිලි, කාටූන්, ප්‍රශ්න හා පිළිතුරු, ගණිත ගැටලු, විදෙස් ප්‍රවෘත්ති, පාඨක අදහස් හා ඡායාරූප ආදිය පිටුවට ඇතුළත් කළ හැකිය. සමස්තයක් වශයෙන් බිත්ති පුවත්පත කියවන්නන්ට ආකර්ශනීය ලෙස පිටුව සැලසුම් කර - වර්ණවත්ව ඉදිරිපත් කළ යුතුය. බිත්ති පුවත්පත සකස් කළ යුත්තේ ඍජුවම අදාළ බෝඩ් එක මත අකුරු ලිවීමෙන් හා සුදුසු පරිදි නිර්මාණාත්මක ලෙස වර්ණ කඩදාසි හා සිත්තම් ආදිය ඇලවීමෙනි.

10. බිත්ති පුවත්පතට ඇතුළත් කළ යුතු වැදගත්ම විශේෂාංගයක් නම් සංස්කාරක ලිපියයි. කාලීන වශයෙන් වැදගත් වන තේමාවක් - මාතෘකාවක් ඔස්සේ සංස්කාරක ලිපිය ලිවීම් වගකීම පැවරෙන්නේ ප්‍රධාන සංස්කාරකටය. එසේ වුවත් එය සංස්කාරක මණ්ඩලය විසින් සාකච්ඡා කොට සම්පාදනය කළ හැකිය.

11. බිත්ති පුවත්පත සතිපතා සඳුදා ප්‍රදර්ශනයට ඉදිරිපත් කරන්නේ නම් එය පෙර සතියේ සිකුරාදා වන විට නිම කර තිබිය යුතුය. එවිට එම පුවත්පත ගුරු භවතුන්ටද, විදුහල්පතිතුමාට / තුමියටද පෙන්වා අනුමත කරවා ගත යුතුය.

12. බිත්ති පුවත්පත රූ රටා සැලසුම් කිරීම සඳහා පාසලේ චිත්‍ර ශිල්පය හදාරන සිසු සහෝදර සහෝදරයන්ගේ සහය ලබා ගැනීම උචිතය. බිත්ති පුවත්පත සඳහා බෝඩ්, පාට පැන්සල්, දිය සායම්, වාර්නිෂ් කඩදාසි, ටිෂූ කඩදාසි. පැස්ටල්, තෙල් කඩදාසි, කැලැන්ඩර් පින්තූර ආදිය යොදා ගන්නට සිදු වේ.

13. වර්ණ වාර්නිෂ් කඩදාසි කපා ඇලවීම හා ඒ මත ලිවීම, වර්ණ කඩදාසි තීරු කපා ඇලවීම, පාට කිරීම, කඩදාසි තීරු ඉරා ඇලවීම, කඩදාසි ඉරා ඇලවීම හා ඒ මත ලිවීම ආදී විවිධ රූ රටා සැලසුම් ක්‍රම බිත්ති පුවත්පත නිර්මාණය කිරීමේදී යොදා ගත හැකිය.

14. බිත්ති පුවත්පත ප්‍රදර්ශනය කළ යුත්තේ පාසලට පැමිණෙන කාට වුවත් දර්ශනය වන තැනකය. ඒ සඳහා සුදුසු ස්ථානයක් සාකච්ඡා කොට ලබා ගත යුතුය. එසේම බිත්ති පුවත්පත සාමාන්‍ය කෙනෙකුට කියවිය හැකි තරමේ උසකින් යුක්ත පුවරුවක ප්‍රදර්ශනය කළ යුතුය. පාසල විසින් සකස් කර ගත් පුවරුවක් හෝ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් පාසල්වලට ලබා දෙන බිත්ති පුවත්පත් පුවරුවක් හෝ මේ සඳහා යොදා ගත හැකිය.

15. ඉවත් කරනු ලබන බිත්ති පුවත්පත් සුරක්ෂිතව තබා ගන්න. ඉදිරියේදී පාසල් මාධ්‍ය සමාජ උළෙල පවත්වන අවස්ථාවක පැරණි බිත්ති පුවත්පත් ප්‍රදර්ශනය කළ හැකි වේ. එසේම වර්ෂයක් අවසාන වන විට ඒ ඒ බිත්ති පුවත් පත් නිර්මාණය කරන්නට උර දුන් දරුවන් ඇගයීමේ උළෙලක් පවත්වා ඔවුන්ට සහතික පිරි නැමිය යුතුය.

## ආදර්ශ බිත්ති පුවත්පතක්



# 10. ගෘහස්ථ පුස්තකාලය
(Home Library)

පාසල් මාධ්‍ය සමාජයේ මෙහෙයවීමෙන් එහි සාමාජිකයන්ට ගෘහස්ථ පුස්තකාල වැඩසටහන හඳුන්වා දිය යුතුය. හැකි නම් එය පාසලේම වැඩසටහනක් බවට පත් කළ හැකිය.

සෑම නිවසකම කුඩා පුස්තකාලයක් ආරම්භ කොට පවත්වා ගෙන යෑම මෙම වැඩසටහනේ පරමාර්ථයයි. ගෘහස්ථ පුස්තකාලයක් යනු විශේෂයෙන් රාක්ක සහිතව පවත්වා ගෙන යන්නක්ම නොවේ. ඒ සඳහා කාඩ්බෝඩ් පෙට්ටියක් වුවත් ප්‍රමාණවත්ය. මෙහිදී වඩාත්ම වැදගත් වන්නේ තමන්ගේ පොත් එකතුවක් නිවසේ පවත්වා ගෙන යාමයි.

දෙමාපියන්ට මේ පිළිබඳව දැන්වීමෙන් ඔවුන්ට වරින් වර පොත් මිල දී ගෙන දෙනු ඇත. එය අඩුම වශයෙන් මාසයකට එකක් විය හැකිය. තමන්ට ලැබෙන කුමන පොතක් වුවද කියවන්නට පුරුදු විය යුතුය. සමහර පොත්වල අන්තර්ගතය එක් වරම තේරුම් ගන්නට බැරි වනු ඇත. එහෙත් කාලයක් යන විට ඒවා තේරුම් ගත හැකි වනු ඇත.

උපන් දිනයට හෝ අලුත් අවුරුද්දට හෝ ජනවාරි පළමුවෙනිදාට හෝ ඔබට පොතක් තෑගි කරන්නට දෙමාපියන් පොලඹවා ගන්නට ඔබට හැකියාව ලැබේ. ඔබේ ඥාතීන්ද එසේ ඔබට පොත් තෑගි කරනු ඇත.

මේ ආකාරයෙන් ඔබ ළඟ එක් රැස් වන පොත් ඔබේ මිතුරු මිතුරියන් සමග හුවමාරු කර ගන්නටද පුළුවන. ඒ මගින් ඔබට පොත් වැඩි ප්‍රමාණයක් කියවන්නට අවස්ථාව සැලසේ.

ඔබ ළඟ ඇති පොත්වල ලේඛනයක් පවත්වා ගෙන යන්න. අන්‍යයන් සමග පොත් හුවමාරු කර ගන්නේ නම් ඒ පිළිබඳවත් සටහනක් තබා ගන්න. කිසිවෙකු ඔබගෙන් පොතක් ගෙන ගොස් එය ආපසු නොදුන්නේ නම් ඒ ගැන පසුතැවිලි නොවන්න. දුක් නොවන්න.

ඉගෙන ගන්නා දරුවන් තුළ භාෂාව පෝෂණය වන්නටද, විවිධ අදහස් සංවර්ධනය කර ගන්නටද පොත් කියවීම තරම් අගනා ක්‍රමයක් තවත් නැත. ඔබගේ ගෘහස්ථ පුස්තකාලයට අමතරව පාසලේ පුස්තකාලයෙන්ද පොත් ගෙන කියවන්නට පුරුදු වන්න.

# 11. අත්දැකීම් හුවමාරු වැඩසටහන්
## (Experience Exchange Programs)

අන්‍ය පාසල් සමග අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් පාසල් මාධ්‍ය සමාජය විසින් සැලසුම් කොට ක්‍රියාත්මක කළ හැකිය. අවම වශයෙන් වාරයකට එකක් එසේ කළ හැකි ඉතා ප්‍රයෝජනවත්ය.

කුමන පාසල් සමග හුවමාරු වැඩසටහන් සැලසුම් කරන්නේද? යන්න තීරණය කළ යුත්තේ පාසල් මාධ්‍ය සමාජය භාර ගුරු මව්වරුන් /ගුරු පියවරුන්ගේ අනුමැතිය ඇතිවය. මේ සඳහා ආගමික වශයෙන් වෙනස් පාසල් යොදා ගැනීමෙන් පාසල් අතර සහජීවනය වර්ධනය කර ගත හැකිය.

උදාහරණයක් වශයෙන් මුස්ලම් පාසලක හා හින්දු පාසලක මාධ්‍ය සමාජ සාමාජිකයන් පිරිසකට සිංහල පාසලකට පැමිණෙන ලෙස ආරාධනය කළ හැකි. අනෙක් පාසල්වලටද එසේ කළ හැකිය.

අත්දැකීම් හුවමාරු වැඩසටහනකට එක් කර ගන්නා අනෙක් පාසල්වල ආරාධිතයන් සංඛ්‍යාව කොපමණද, වැඩ සටහනේ සැලැස්ම කුමක්ද? ආදිය කල් ඇතිව නිගමනය කොට එයට සූදානම් විය යුතුය.

අත්දැකීම් හුවමාරු වැඩසටහනක් හැම විටම සතුටින් හා බුද්ධි ප්‍රබෝධයෙන් යුතුව නිම විය යුතුය. කිසිදු තැනක අතපසු වීමක් සිදු නොවන්නට සංවිධායකවරු වග බලා ගත යුතුය.

එසේම සිංහල පාසලක් විසින් හින්දු ආගමික දිනයක් හෝ මුස්ලිම් ආගමික දිනයක් හෝ හින්දු හෝ මුස්ලිම් සංස්කෘතික දිනයක් සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමද මේ ආකාරයේ අත්දැකීම් හුවමාරු වැඩසටහනකි. මේවා පාසලකට අලුත් අත්දැකීමක් ගෙන එයි.

මේ ආකාරයෙන් තෝරා ගත් පාසල් තුනක් යොදා ගෙන සෑම මසකටම වරක් අත්දැකීම් හුවමාරුව සඳහා ඒ ඒ පාසල්වලට යා හැකිය. එයින් විවිධ ජාතීන් හා ආගමිකයන් සමග සුහදතාව වර්ධනය වේ.

බහු වාර්ගික / බහු ආගමික / බහු සංස්කෘතික රටක දරුවන් තුළ සමාජීය සහජීවනය වැඩි දියුණු කිරීමට පාසල් මාධ්‍ය සමාජයට ඇති අයිතිය හා වගකීම බැහැර නොකළ යුතුය.

## 12. ප්‍රකාශන වැඩසටහන්
## (Publishing Programs)

මාධ්‍ය සමාජයේ මෙහෙයවීමෙන් පාසල තුළ ප්‍රකාශන වැඩසටහනක් ක්‍රියාත්මක කළ හැකිය.

1. වාර්ෂික සඟරාවක් මුද්‍රණයෙන් ප්‍රකාශ කිරීම
2. කෙටි කතා එකතුවක්, පද්‍ය රචනා එකතුවක් ප්‍රකාශ කිරීම
3. නවකතාවක් ප්‍රකාශ කිරීම
4. පුවත්පතක් ප්‍රකාශ කිරීම

නවකතා, කෙටි කතා හා පද්‍ය නිර්මාණ එකතු කර ගන්නට තරග පැවැත්විය හැකිය. එසේත් නැතිනම් එවැනි සාහිත්‍ය නිර්මාණ කරන්නට හැකියාව ඇති කිහිප දෙනෙකු විසින් නිර්මාණය කරන ලද කෙටි කතා හෝ පද්‍ය මේ සඳහා එක් කර ගත හැකිය.

ග්‍රන්ථ ප්‍රකාශන වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම විශේෂිත කාර්යයකි. ඒ සඳහා මුද්‍රණායලයක් සමග සම්බන්ධතා පැවැත්විය යුතුය. මුද්‍රණ කටයුතු පිළිබඳ අත්දැකීම් ඇති ගුරු භවතුන් පාසල්වල සිටී. ඒ නිසා ඔවුන්ගේ සහය පහසුවෙන් මේ සඳහා ලබා ගත හැකිය.

වර්ෂයකට එකක් මෙවැනි ප්‍රකාශනයක් නිම කළ හැකි නම්, ඒ සඳහා පාසල තුළ දැනෙන උත්සවයක් පැවැත්විය හැකිය. ඒ සඳහා අවට පාසල්වලටද ආරාධනා කළ හැකිය. අඩුම වශයෙන් පාසල් මාධ්‍ය දින උළෙලේදී මෙවැනි ප්‍රකාශන එළි දැක්විය හැකිය.

ප්‍රකාශන වැඩසටහනක් පාසලේදී ක්‍රියාත්මක කරන්නට මාධ්‍ය සමාජයේ නිර්මාණාත්මක ව්‍යාපෘතිය යොදා ගත හැකිය. එයින් ලැබෙන අත්දැකීම පාසල් විෂය මාලාව ඉක්මවා යයි. එහෙත් එය ඇත්තටම ජීවිත අත්දැකීමකි.

මෙවැනි ප්‍රකාශන දොරට වැඩීමක් සිදු වන අවස්ථාවකට ආරාධිතයෙකු ලෙස ඒ ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකුට ආරාධනය කළ හැකිය. සමහර විට පාසලින්ම බිහි වූ එවැන්නන් සිටිය හැකිය. එසේත් නැතිනම් ප්‍රදේශයේ සිටිය හැකිය. ඔවුන්ගේ සහාය පාසලට පහසුවෙන් ලබා ගත හැකිය. ඒ සඳහා මාධ්‍ය සමාජයේ බාහිර කමිටුව යොදා ගත හැකිය.

# 13. පාසල් මාධ්‍ය සමාජ තේමා ගීතය
(School Media Club Theme Song)

ඉහත නම් දෙකින් එකක් සඳහන් කොට සෙවීමෙන් අන්තර්ජාලයෙන් මෙම ගීත ගායනය ලබා ගත හැකිය.

සොයුරු දමින් වෙළිලා - කතා බහයි සිනා රැළයි
මිතුරු දමින් බැඳිලා - දස්කම් විස්කම් ඔබ නංවයි
මේ අපගේ පාසල් මාධ්‍ය සමාජයයි

උතුරු දිගින් - දකුණු දිගින්
නැගෙනහිරින් - බසිනහිරෙන්
තොරතුරු තොරතුරු තොරතුරු තොරතුරු
තොරතුරු සුළඟක් හමාන එනවා
තොරතුරු සුළඟේ අප පා වෙනවා

දෙසවන් ඇසෙනා - දෙනෙතින් පෙනෙනා
දෙතොලින් කියනා - මනසින් සිතනා
සිතුවිලි සිතුවිලි සිතුවිලි සිතුවිලි
සිතුවිලි පොකුරක් සුළඟෙ ඇදෙනවා
සිතුවිලි පැතිරී ලොවම දිනනවා

පද රචනය: බන්දුල පී. දයාරත්න

තනුව සහ සංගීත සංයෝජනය: රංජිත් ජයරත්න

(මධ්‍යම පළාත් සංගීත විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - මහනුවර)

## පාසල් මාධ්‍ය සමාජ තේමා ගීතයේ සංගීත සංයෝජනය

Tempo = ♩ = 108 4/4

පෙර අතුරු වාදනය

ST සනි සං - නි | සං - නි ප | ප නි රි නි | ස - - -
පම ප - මං | ප - ම ග | නි නි නි ග | ස - - -
FL නි - - ස | ග - - ප | ම ප ම ග | ස - - -
නි - - ස | ග - - ප | ම ප ම ග | ස - - -
GT සංනි ප නි සං

ගීතය

ප ප - ම | ග - ම ප | ග - ස - | - - - -
ST ප + ST ස +
නි නි - ග | ස - - - | ප ප - ම | ස - - -
ප නි සං නි | ප - ම නි | ප - - - | - - - -
ම - ම ග | ම - ම - | ග ප ම ග | ස - - -
නි - නි නි
ST පනි සං+
ස - - - | ප - ප ම | ග - - ම | ප ම - ග
ස - - -

අන්තරා කොටස

ST පනි ස+ ST ගරි ස+
නි නි නි නි | සං - - - | ප ප නි නි | ස - - -
ප - ප ම | ප - - - | ග ප ම ග | ස - - -
නි නි නි නි
ග ග ග ග | ප ප ප ප | සං සං සං සං | නිනි නිනි ගග ගග
පප පප සංසං සංසං | ප ප ම ම | නි නි නි - | ප ප - ම
ප ප ප -
ප ප ප ම | ග ග ග ග | නි නි ග ග | ස - - -

# 14. වර්ෂය පුරා හා වාර්ෂිකව

මාධ්‍ය සමාජයේ ක්‍රියාකාරකම් වර්ෂය පුරා පැතිරී යන ආකාරයෙන් සැලසුම් කළ යුතුය. ඒ අතර අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම්ද තිබේ. ඒවා කිහිපයක් මෙසේය.

1. දිනපතා උදා ගුවන් විකාශය
2. සතිපතා බිත්ති පුවත්පත් සම්පාදනය හා ප්‍රදර්ශනය
3. සතිපතා / දෙසතියකට වරක් / මාසිකව රැස්වීම
4. වාරයකට එකක් බැගින් පුවත්පතක් ප්‍රකාශ කිරීම
5. ගෘහ පුස්තකාල වැඩසටහන ක්‍රියාත්මක කිරීම
6. අපේ උරුමය පාසල් මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම

වාර්ෂික ක්‍රියාකාරකම් යනු වර්ෂයකට එක් වරක් පමණක් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම්ය.

1. වාර්ෂික සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම
2. වාර්ෂික මාධ්‍ය උළෙල පැවැත්වීම
3. වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය
4. මාධ්‍ය වැඩහුරුව වැඩසටහන ක්‍රියාත්මක කිරීම
5. පාසල් සිනහ දිනය වැඩසටහන ක්‍රියාත්මක කිරීම
6. යුනෙස්කෝ ලෝක පොත් දිනය වැඩසටහන ක්‍රියාත්මක කිරීම

යම් ලිත් වර්ෂයක් අවසාන වන විට ඊ ළඟ වර්ෂයේ ක්‍රියාකාරකම් සැලැස්ම සම්පාදනය කළ යුතුය. ඒ නිසා ඒ අවස්ථාවේදීම ඊ ළඟ වර්ෂයටය අදාළ නිලධාරින් හා ක්‍රියාකාරී මණ්ඩලය තෝරා ගත යුතුය.

මෙහිදී ප්‍රධාන තනතුරුවලට 10 හා 12 සිසු දරු දැරියන්ගෙන් තෝරා ගැනීම වඩාත් උචිතය. මක් නිසාද යත් 11 හා 13 යනු විභාග වර්ෂ වන බැවිනි. එහෙත් ඔවුන්ට තම අභිමතය පරිදි යම් ව්‍යාපෘතියක ක්‍රියාකාරකමක් කරන්නට බාධාවක් නැත.

පාසල් මාධ්‍ය සමාජය කළමනාකරණය කිරීමේදී ඉතාම වැදගත් කාර්යයක් නම් නිතිපතා ලිඛිත සටහන් තබා ගැනීමයි. එය මාධ්‍ය සමාජය භාර ගුරු භවතාගේද, සභාපතිගේද, ලේකම්ගේද වගකීමකි. එම සටහන් සම්පිණ්ඩණය කර වාර්ෂික අවසාන වාර්තාව සම්පාදනය කළ හැකිය.



ISBN 978-624-6073-01-5
9 786246 073015